ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

32 වෙළුම 1-2 කලාපය 2013 ජනවාරි - පෙබරවාරි




# 2013 ලෝක ආර්ථිකය මන්දගාමීව ඉදිරියට

ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# 2013 ලෝක ආර්ථිකය මන්දගාමීව ඉදිරියට...

අපට හෙට දවස පිළිබඳ අරමුණු ඇත. අපේක්ෂා ඇත. අප කටයුතු කරන්නේ ඒ අරමුණු සහ අපේක්ෂා ඉටුකරගැනීමේ ඉලක්ක ඇතිව ය. එහිදී අප හමුවේ පැන නගින අභියෝග රැසකි. ඒවා ජයගැනීමට, පෙර සූදානමක් තිබීම කටයුතු පහසු කරයි. අප තනි තනි පුද්ගලයින් ලෙස ක්‍රියාකරන ආකාරයෙන් ම රටක ආර්ථිකය සම්බන්ධයෙන් ද කටයුතු සිදු කෙරෙන්නේ එසේම ය.

ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉදිරි අපේක්ෂාව ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 4000 ඉලක්කය කරා ළඟාවීම යි. 2013 වසරෙහි දළ දේශීය නිෂ්පාදිතය සියයට 7.5 ක් වනු ඇතැයි අපේක්ෂිතය. මෙම අපේක්ෂා අහඹු ලෙස ඉටුවන ඒවා නොවේ. ඒ සඳහා විධිමත් සැලසුම් සම්පාදනයක් සිදුවෙයි. ගතවූ වසරවල ආර්ථිකයෙහි හැසිරීම පිළිබඳව විමසා බැලෙයි. ඒ අනුව 2010 සහ 2011 වසරවල ශක්තිමත් ආර්ථික වර්ධනයක් දක්නට ලැබුණ ද 2012 දී එය තරමක් මන්දගාමී වූ බවක් දක්නට ලැබෙයි. කෙසේ වෙතත් සාමයේ ප්‍රතිලාභ පැහැදිලිව ම දක්නට ලැබිණි. ආර්ථිකයේ ප්‍රධාන අංශ සෑම එකකම කැපී පෙනෙන ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබිණි. ව්‍යාපාරික විශ්වාසය වර්ධනය විය. එහෙත් 2011 වසරට සාපේක්ෂව 2012 වසරෙහි ලෝක ආර්ථිකයේ දක්නට ලැබුණේ පහළ වැටීමකි. එමෙන් ම 2013 වසරෙහි ද පෙර අපේක්ෂා කරන ලද තරමින් ආර්ථික වර්ධනයක් දක්නට නොලැබෙන බැව් ද 2008 - 2011 ඇති වූ ආර්ථික අර්බුදයෙන් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වන්නේ ඉතාමත් ම මන්දගාමීව බැව් ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව ඇතුලු නොයෙකුත් සංවිධාන පුරෝකථනය කරයි.

සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ මූලිකව ම විමසා බැලෙන දළ දේශීය නිෂ්පාදිතය, විරැකියාව සහ උද්ධමනය යන කරුණු සම්බන්ධයෙන් ලෝක ආර්ථිකය මුහුණ පා ඇති තත්ත්වය සතුටුදායක නොවේ. 2012 වසරෙහි සියයට 2.3ක් වූ එක්සත් ජනපද ආර්ථික වර්ධනය 2013 දී සියයට 2.0ක් වනු ඇති බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරයි. 2012 වසරෙහි මෙන් ම 2013 දී ද යුරෝ කලාපීය රටවල ආර්ථික සංකෝචනය වනු ඇතැයි අපේක්ෂිත ය. එමෙන් ම සමස්තයක් වශයෙන් ලෝක ආර්ථිකයේ දක්නට ලැබෙනු ඇත්තේ සියයට 3.5 ක් පමණ වූ වර්ධනයකි. ආර්ථික වර්ධනයේ පහළ වැටීම සහ සංකෝචනය විසින් යුරෝ කලාපයේ නිෂ්පාදන සහ කර්මාන්ත අංශය පාඩු ලබන තත්ත්වයට ඇද වැටී ඇත. එහි ප්‍රතිඵල ලෙස ආයතන වැසී යමින් පවතී. සිය, දහස් ගණන් ජනයා රැකියා වියුක්ති වූවන්ගේ ගොන්නට එක්වෙමින් සිටී. අනෙක් අතට මිල මට්ටම්වල සිදුවන ඉහළ යෑම් විසින් ද ජන ජීවිතය අතිශය ඛේදජනක තත්ත්වයකට හෙළා ඇත. සමාජ අසහනය නොයෙකුත් ආකාරයෙන් හිස ඔසවමින් තිබේ. මහජන ඉල්ලීම්, උද්ඝෝෂණ හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා බවට පෙරළෙමින් පවතී.

ලෝක ආර්ථිකයේ සිදුවන උත්පාත, අවපාත, අර්බුද ආදී කිසිවකින් මුලුමනින් ම වියුක්තව සිටීමට ශ්‍රී ලංකා ආර්ථිකයට හැකියාවක් නැත. ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන අපනයන ගැනුම්කරුවන් ලෙස ගැනෙන ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඇතැම් යුරෝපීය රටවල් සිය ආර්ථික යළි යථා තත්ත්වයට පත්කර ගැනීමේ දැඩි ප්‍රයත්නයක යෙදී සිටිති. ඒ සඳහා විවිධ පියවර අනුගමනය කරමින් සිටිති. මෙම රටවල් කිනම් තත්ත්වයකට මුහුණ පෑව ද එහි බලපෑම ශ්‍රී ලංකාවට ද නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථික කෙරෙහි ද බලපානු ඇත. මෙවර සටහන 2013 ලෝක ආර්ථිකය සම්බන්ධව කෙරෙන පුරෝකතන පිළිබඳ විමසුමක යෙදේ.✪

සටහන ISSN 1391-3697
2013 ජනවාරි/ පෙබරවාරි

පිටපතක මිල : රු. 10.00
වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

| ලිපි යොමුව | පිටුව |
|---|---|
| 2013 ලෝක ආර්ථිකය | 3 |
| ශ්‍රී ලංකාවේ උකස් නීතිය පිළිබඳ හැඳින්වීමක් | 12 |
| හරිත දළ දේශීය නිෂ්පාදිතය හඳුන්වා දීම | 16 |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# 2013 ලෝක ආර්ථිකය

**විනීතා හේරත්**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

සංවර්ධනය වෙමින් පවත්නා රටවල බොහෝ දෙනෙක් සංවර්ධිත රටවල් කරා සංක්‍රමණයවීමේ සිහිනයක වෙලී සිටිති. යුරෝපාකරයෙහි රැකියා සොයා යෑමේ අපේක්ෂාවෙහි ඇලී ගැලී සිටිති. එහෙත් එම රටවලින් වසර කිහිපයක සිට නිරතුරුව අසන්නට ලැබෙන්නේ කර්මාන්තශාලා වැසී යෑම් පිළිබඳව ය. දහස් ගණනින් කෙරෙන රැකියා කප්පාදු කිරීම් පිළිබඳව ය. වියදම් කපා හැරීම් පිළිබඳව ය. සමාජ අසහනය සහ නොසන්සුන්තාව පිළිබඳව ය. ලෝකය 2013 වසරට පිළිපන්නේ මෙවන් කලබැගෑනි සමූහයක් සමඟ ය. 2008 වසරෙහි ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඇරඹී යුරෝපාකරය හරහා හමා ගිය මූල්‍ය සුළි කුණාටුව විසින් එකී ආර්ථික කළඹාලීය. එයින් ඇති කළ අයහපත් ඵල තව ම මුලුමනින් ම සමනය වී නැත. අර්බුදයේ අහිතකර ඵල විඳ දරාගැනීමට සිදුවූයේ සෘජුව ම ඊට මැදි වූ රටවලට පමණක් නොවේ. ආනයන අපනයන වෙළෙඳාම හරහා සහ වෙනත් විවිධ ආකාරයෙන් එම රටවල් සමඟ සම්බන්ධව සිටින අනෙකුත් සෑම රටකට ම පාහේ විවිධ පරිමාණයෙන් අර්බුදය බලපෑවේ ය.

ලෝක ආර්ථිකයේ වරින් වර විවිධ හේතු මත පැන නැගුණු මෙවැනි පසුබෑම් රැසකි. පළමුවන සහ දෙවන ලෝක යුද්ධ, කොරියන් යුද්ධය සහ වියට්නාම් යුද්ධය අවස්ථාවල ද ඛනිජ තෙල් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගිය අවස්ථාවල ද එවන් අර්බුද පැන නැගිනි. එමෙන් ම බැංකු පිළිබඳ මහජන විශ්වාසය බිඳ වැටීමෙන් හා කොටස් වෙළෙඳපොළ අනපේක්ෂිත බිඳවැටීම්වලින් ද ලෝක ආර්ථිකය විවිධ අවස්ථාවල අර්බුදවලට මුහුණ පෑවේ ය. ඇතැම් අවස්ථාවල මාස කිහිපයක් තුළ හෝ වසර 2, 3 ක් හෝ තුළ ආර්ථික යළි යථා තත්ත්වයට පත් වීමෙන් මෙම පසුබෑම් අවසන් විය. එහෙත් ලෝක ආර්ථිකය මුහුණ පෑ අර්බුද සියල්ල අතුරින් 1930 මහා ආර්ථික අවපාතය විශේෂ ය. එය දශකයකටත් වැඩි කාලයක් දක්වා පැවතිණි. මෙම අවපාතයෙන් එවකට ද ලෝකයේ ප්‍රබල සහ ශක්තිමත් ආර්ථික ලෙස පැවතුණු මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ජර්මනිය සහ ඔස්ට්‍රේලියාව වැනි රටවල් ආර්ථික සහ සමාජයීය වශයෙන් දැඩි පීඩාවකට, කම්පනයකට ලක් විය. එම ආර්ථික අවපාතයෙන් පසු ඇතිවූ විශාලත ම ආර්ථික පසුබෑම සිදුවූයේ 2008 - 2011 කාල සීමාවේ යි. එකී පසුබැස්මෙන් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පැවතිය ද එය සිදුවන්නේ ඉතාමත් ම මන්දගාමීව ය. ලෝක ආර්ථිකයේ සිදුවන වෙනස්කම් පිළිබඳව නොයෙකුත් ආයතන, සංවිධාන නිරතුරුව විමසිල්ලෙන් පසුවෙයි. ආර්ථිකයේ ගමන් මඟ පිළිබඳව අධ්‍යයනවල නිරත වෙයි. ඒ අනුව ලෝක ආර්ථිකයෙහි පෙර ගමන් මඟ පිළිබඳව, ඉදිරි අපේක්ෂා පිළිබඳව පුරෝකථන ඉදිරිපත් කරයි. මේ ඒ පිළිබඳව කෙරෙන කෙටි සටහනකි.

**ආර්ථික වර්ධනය**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවලට අනුව 2012 තුන්වන කාර්තුවෙහි ලෝක ආර්ථික වර්ධනය යහපත් අතට හැරෙන ලකුණු පෙන්වමින් සියයට 3ක පමණ වර්ධන අනුපාතයක් වාර්තා කළේ ය. නැගී එන ආර්ථිකවල වර්ධනය සහ විස්මයජනක ලෙස එක්සත් ජනපද ආර්ථිකයෙහි ඉහළ නැගීම ඊට හේතුවී ඇත. මූල්‍ය තත්ත්වය ස්ථාවර වන ලකුණු පහළ විය. 2012 සිව්වන කාර්තුව වන විට මූල්‍ය තත්ත්වය වර්ධනය වුවත් එය ශක්තිමත් එකක් නොවූ බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවසයි. තුන්වන කාර්තුවේ ලෝක ආර්ථිකයේ සිදුවූ වර්ධනය තාවකාලික හේතු මත (විශේෂයෙන් ම එක්සත් ජනපදයේ) පැන නැගී ඇතැයි මූල්‍ය අරමුදල වැඩි දුරටත් පවසයි. අරමුදල විසින් 2012 ඔක්තෝබර් මස ලෝක ආර්ථිකය පිළිබඳ ප්‍රකාශයට පත් කළ පුරෝකතන 2013 වසරෙහි මුල

යළිත් වතාවක් යාවත්කාලීන කර ඇත. ඒ අනුව 2013 වසරෙහි ලෝක ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වනු ඇති බැව් 2013 වසර සඳහා වූ ලෝක ආර්ථික අපේක්ෂා (World Economic Outlook) යාවත්කාලීන කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවසයි. නවතම පුරෝකථනවලට අනුව 2012 වසරෙහි සියයට 3.2 ක් වූ ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය 2013 වසරෙහි සියයට 3.5ක් වනු ඇතැයි අපේක්ෂිත ය. (01 වන සංඛ්‍යා සටහන) ඒ අනුව ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්

**01 වන සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ධනය**


**2011 - 2014**

| ප්‍රතිශතාත්මක වෙනස | | | පුරෝකතනය කරන ලද | | 2012 ඔක්තෝබර් මස කරන ලද පුරෝකතන අතර වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2013 | 2014 |
| ලෝකය | **3.9** | **3.2** | **3.5** | **4.1** | **-0.1** | **-0.1** |
| සංවර්ධිත රටවල් | **1.6** | **1.3** | **1.4** | **2.2** | **-0.2** | **-0.1** |
| එක්සත් ජනපදය | 1.8 | 2.3 | 2.0 | 3.0 | -0.1 | 0.1 |
| යුරෝ කලාපය | 1.4 | -0.4 | -0.2 | 1.0 | -0.3 | -0.1 |
| ජර්මනිය | 3.1 | 0.9 | 0.6 | 1.4 | -0.3 | 0.1 |
| ප්‍රංශය | 1.7 | 0.2 | 0.3 | 0.9 | -0.1 | -0.2 |
| ඉතාලිය | 0.4 | -2.1 | -1.0 | 0.5 | -0.3 | 0.0 |
| ස්පාඤ්ඤය | 0.4 | -1.4 | -1.5 | 0.8 | -0.1 | -0.2 |
| ජපානය | -0.6 | 2.0 | 1.2 | 0.7 | 0.0 | -0.4 |
| එක්සත් රාජධානිය | 0.9 | -0.2 | 1.0 | 1.9 | -0.1 | -0.3 |
| කැනඩාව | 2.6 | 2.0 | 1.8 | 2.3 | -0.2 | -0.1 |
| වෙනත් සංවර්ධිත රටවල් | 3.3 | 1.9 | 2.7 | 3.3 | -0.3 | -0.1 |
| අලුතින් කාර්මීකරණය වූ ආසියාතික රටවල් | 4.0 | 1.8 | 3.2 | 3.9 | -0.4 | -0.2 |
| **නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල්** | **6.3** | **5.1** | **5.5** | **5.9** | **-0.1** | **0.0** |
| මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය | 5.3 | 1.8 | 2.4 | 3.1 | -0.1 | 0.0 |
| ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් | 4.9 | 3.6 | 3.8 | 4.1 | -0.3 | -0.1 |
| රුසියාව | 4.3 | 3.6 | 3.7 | 3.8 | -0.2 | -0.1 |
| රුසියාව හැර | 6.2 | 3.9 | 4.3 | 4.7 | -0.5 | -0.1 |
| සංවර්ධනය වෙමින් පවත්නා ආසියාව | 8.0 | 6.6 | 7.1 | 7.5 | -0.1 | 0.0 |
| චීනය | 9.3 | 7.8 | 8.2 | 8.5 | 0.0 | 0.0 |
| ඉන්දියාව | 7.9 | 4.5 | 5.9 | 6.4 | -0.1 | 0.0 |
| ආසියාන් රටවල් | 4.5 | 5.7 | 5.5 | 5.7 | -0.2 | 0.0 |
| ලතින් ඇමෙරිකා හා කැරිබියන් රටවල් | 4.5 | 3.0 | 3.6 | 3.9 | -0.3 | -0.1 |
| බ්‍රසීලය | 2.7 | 1.0 | 3.5 | 4.0 | -0.4 | -0.2 |
| මෙක්සිකෝව | 3.9 | 3.8 | 3.5 | 3.5 | 0.0 | 0.0 |
| මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාව | 3.5 | 5.2 | 3.4 | 3.8 | -0.2 | 0.0 |
| උප සහරා අප්‍රිකාව | 5.3 | 4.8 | 5.8 | 5.7 | 0.0 | 0.1 |
| දකුණු අප්‍රිකාව | 3.5 | 2.3 | 2.8 | 4.1 | -0.2 | 0.3 |

**මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**

**01 වන රූප සටහන**

**මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




**මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**

වෙමින් පැවතියත් එය සිදුවන්නේ ඉතාමත් ම මන්දගාමීව ය. එමනිසා ආර්ථික පසුබෑමෙන් ගොඩ වීමට ඉවහල් වන ආකාරයේ ප්‍රතිපත්ති ඇති කළ යුතු බව වාර්තාව අවධාරණය කරයි. මූල්‍ය අරමුදල පුරෝකථනය කරන පරිදි 2014 දී ලෝක ආර්ථිකයෙහි වර්ධනය සියයට 4.1 ක් වේ යැයි අපේක්ෂිත ය. මෑත කාලීන ලෝක ආර්ථිකයෙහි පිරිහීම ඇරඹීමට පෙර එහි වාර්ෂික වර්ධන අනුපාතය සියයට 4.5 - 5.5 ක මට්ටමක පැවතිනි. (01 වන රූප සටහන)

ලෝක ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් 2012 ජූනි මස ලෝක බැංකුව විසින් කළ පුරෝකථන ද යළි යාවත්කාලීන කර ඇත. ඒ අනුව 2013 වර්ෂයෙහි ලෝක ආර්ථිකය සියයට 3 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකතනය කර තිබුණ ද යුරෝපා කලාපයේ පසුබැසීම්, එක්සත් ජනපදයේ ණය ගැටලු, චීන ආයෝජනයේ පහළ වැටීම ආදි කරුණුවල බලපෑමෙන් ආර්ථික වර්ධනය සියයට 2.4 වනු ඇති බවට යාවත්කාලීන කර ඇත. 2014 දී මෙම අනුපාතය සියයට 3.1ක් වනු ඇති බවට ද පුරෝකථනය කරයි. යාවත් කාලීන කරන ලද ලෝක බැංකු පුරෝකථන අනුව සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සියයට 5.1 ක් ලෙස පසුගිය දශකයේ අඩුම ආර්ථික වර්ධනය වාර්තා කළේ ය. 2014 වන තුරු යුරෝ කලාපයෙහි සුභදායී ලකුණු දක්නට නොලැබෙනු ඇත.

එකී කලාපයෙහි ස්වෛරීත්ව ණය අර්බුදය නිසා මෙම වසරෙහි දළ දේශීය නිෂ්පාදිතය සියයට 0.1කින් සංකෝචනය වනු ඇත. 2011 වසරෙහි සියයට 8.3 ක් වූ නැගෙනහිර ආසියා සහ පැසිෆික් කලාපයෙහි ආර්ථික වර්ධන අනුපාතය 2012 වසරෙහි සියයට 7.5 ක් දක්වා පහළ වැටිනි. ලෝක බැංකු වාර්තා ඊට හේතු ලෙස දක්වන්නේ විදේශ ඉල්ලුමෙහි පහළ යෑම සහ උද්ධමන පාලනය සඳහා චීනය ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ය. 1999 සිට චීන ආර්ථිකය අඩුම වර්ධන අනුපාතයක් වාර්තා කළේ 2012 වසරේ ය. එය සියයට 7.9ක් විය. 2011 වසරෙහි එරට ආර්ථික වර්ධන අනුපාතය සියයට 9.3ක් විය. 2013 වසරෙහි මෙම අනුපාතය සියයට 8.4 ක් වනු ඇති බවට ලෝක බැංකු වාර්තා පුරෝකථනය කරයි. ජපානයෙහි ආර්ථික වර්ධනය සියයට 1.5ක් වනු ඇති බවට කර තිබූ ලෝක බැංකු පුරෝකථනය සියයට 0.8ක් ලෙස යාවත්කාලීන කර ඇත.


ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා යුරෝපා කලාපයේ හා එක්සත් ජනපදයේ අර්බුද අවදානම් අඩුකර ඇතත් දිගින් දිගට ඇදී යන සංකෝචනයකට පසු යථා තත්ත්වයට පත්වීමට යුරෝපා කලාපයට තවදුරටත් කල් ගතවනු ඇත.

මූල්‍ය අරමුදලේ පුරෝකථනයට අනුව 2012 සියයට 2.0ක් වූ ජපාන ආර්ථිකයේ වර්ධනය 2013 සහ 2014 දී පිළිවෙලින් සියයට 1.2ක් සහ සියයට 0.7 ක් වනු ඇතැයි අපේක්ෂිත ය. එහෙත් 2013 ජනවාරි 23 - 27 දක්වා ස්විට්සර්ලන්තයේ ඩාවෝස් (Davos) නගරයේ පැවති වාර්ෂික ලෝක ආර්ථික සමුළුවේ (World Economic Annual Meeting) 43 වන සැසි වාරයේ දී ජපන් ආර්ථිකය සම්බන්ධයෙන් පළවූයේ මෙයට වඩා වෙනස් මතයකි. එයට සහභාගී වූ ජපන්, චීන සහ අප්‍රිකා නියෝජිතයන් ලෝක ආර්ථිකයේ ඉදිරි අපේක්ෂා පිළිබඳව දැක්වූයේ සුභදායී ආකල්පයකි. ජපානයේ ක්‍රියාත්මක කරන්නට යෙදුනු නව ආර්ථික ප්‍රතිපත්ති සහ චීනයේ සහ අප්‍රිකාවේ ශක්තිමත්වීම විසින් ලෝක ආර්ථිකයේ හෙට දවසේ අපේක්ෂා සම්බන්ධයෙන් යම් මන්දාලෝකයක් ලබා දෙනු ඇති බවට මෙහිදී අදහස් පළ විය. එමෙන්ම නැගී එන ආර්ථික සහ අඩු ආදායම් රටවල ආර්ථික වර්ධනය සියයට 5.5 ක මට්ටමක පවතිනු ඇතැයි ලෝක ආර්ථික සංවිධානය පවසයි. මෙම රටවල් කාණ්ඩය සම්බන්ධව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇස්තමේන්තු ද මීට සමාන වේ. කෙසේ නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ක්‍රිස්ටින් ලාගර් (Christine Lagarde) ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම විස්තර කළේ ඉතාමත් ම මන්දගාමීව දුර්වල ආකාරයෙන් සිදුවන බවයි. "අප දැන් ජීවත් වන්නේ ජගත්කරණය වූ ලෝකයකයි. යුරෝපයේ සහ එක්සත් ජනපදයේ කුමක් සිදුවුන ද එහි බලපෑම චීන, ආසියා හා අප්‍රිකා ආර්ථිකවලට බලපානු ඇත." යි එම ලෝක ආර්ථික සමුළුවට සහභාගී වූ චීන මහජන බැංකුවෙහි (People's Bank of China) නියෝජ්‍ය අධිපති යී ගැන්ග් (Yi Gang) පැවසුවේ ය. ලෝක ආර්ථික සංගමයේ නිර්මාතෘ ක්ලවුස් ස්ච්වැබ් (Klaus Schwab) සමුළුවේ සමාරම්භක දේශනය පවත්වමින් ප්‍රකාශකර සිටියේ පවත්නා තත්ත්වය යහපත් අතට හරවනු වස් සංවිධානය වඩාත් ගතික කාර්යභාරයක් ඉටුකළ යුතුව ඇති බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනවලට අනුව, ආර්ථික වර්ධනයේ මන්දගාමී බව ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය ආර්ථික ඇතුළත් සංවර්ධිත රටවලට පමණක් සීමාවී නැත. චීනය, ඉන්දියාව හා බ්‍රසීලය ඇතුලු වේගයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල පවා ආර්ථික වර්ධන වේගය අඩාලවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඇතැම් නැගී එන ආර්ථිකවල සැලකිය යුතු වර්ධනයක් සිදුවුවත් අතැම් රටවල විදේශ වෙළෙඳාමෙහි පහළ වැටීම සහ දේශීය අවහිරතා හේතුවෙන් ආර්ථිකය පසුබෑම්වලට ලක්වනු ඇත. 2011 වසරට සාපේක්ෂව 2012 වසරෙහි චීන ආර්ථිකයේ වර්ධනයේ යම් පසුබෑමක් දක්නට ලැබුණ ද මෙම වසරෙහි එය සියයට සියයට 8.2 ක වර්ධනයක් අත්කරගනු ඇති බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකතනය කරයි. 2011 වසරට සාපේක්ෂව 2012

**02 වන රූප සටහන**

**ක්‍රය ශක්ති සාම්‍යතාව පදනම් කරගනිමින් ගණනය කරන ලද**
**දළ දේශීය නිෂ්පාදිතය අනුව ලොව විශාලතම ආර්ථික - 2012**




**මූලාශ්‍රයඃ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**

බ්‍රසීල ආර්ථික වර්ධනයේ පහළ වැටීමක් දක්නට ලැබුණ ද මෙම වසරෙහි එරට සියයට 3.5 ආර්ථික වර්ධනයක් ළඟාකරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේවෙතත් අර්බුද අවදානම් සිදු නොවුනහොත් සහ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව ම වර්ධනය වුවහොත් ලෝක ආර්ථික වර්ධනය පුරෝකතනය කළ මට්ටමට වඩා ශක්තිමත් විය හැකි ය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ඔලිවියර් බ්ලන්චර්ඩ් (Olivier Blanchard) පවසන්නේ ඉදිරිය පිළිබඳ යම් තරමක සුභදායී අපේක්ෂාවන් තබාගත හැකි වුවත් එය මායාවක් කොට නොගත යුතු බවයි. ඔහු පවසන පරිදි තවදුරටත් සැලකිය යුතු අභියෝග රැසක් ඉදිරියෙහි පවතී. යුරෝ කලාපයේ රටවල් 17 සම්බන්ධව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙර කළ පුරෝකථන පහළ හෙලා ඇත. කලාපයේ ඇතැම් රටවල් ණය අර්බුදය නිරාකරණය සඳහා යම් යම් ධනාත්මක පියවර ගෙන තිබුණත් වර්ධන අපේක්ෂා කෙරෙහි අර්බුද නිරාකරණය සඳහා ගෙන ඇති පියවරවල අවිනිශ්චිතතා පවතී.

සංශෝධිත පුරෝකථනවලට අනුව එක්සත් ජනපද ආර්ථිකය සම්බන්ධයෙන් සුභදායී ලකුණු දක්නට ලැබේ. ඒ අනුව 2013 එක්සත් ජනපදයෙහි ආර්ථික වර්ධනය සියයට 2.0ක් වනු ඇත. නමුත් මෙම අපේක්ෂා නුදුරු දිනයක සිදුවීමට නියමිත බදු සහ වියදම් සංශෝධනය කිරීමේ තීරණ අනුව වෙනස් විය හැකි ය. කෙටි කාලයේ දී තියුණු ලෙස වියදම් කපාහැරීම් නොකළ යුතු බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්සත් ජනපදයට අනතුරු අඟවයි. නමුත් හිමිකම් කපාහැරීමෙන් සහ බදු පැනවීම මගින් මධ්‍ය කාලයේ දී අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගත හැකි වනු ඇති බැව් පුරෝකථනය කර ඇත.

බ්‍රිතාන්‍ය ජාතික සංඛ්‍යා ලේඛන කාර්යාලයේ දත්ත අනුව 2012 හතරවන කාර්තුවේ එක්සත් රාජධානියේ ආර්ථිකය සියයට 0.3කින් සංකෝචනය විය. වර්ෂය තුළ එම ආර්ථිකයෙහි සංකෝචනය සියයට 0.2 ක් වූ බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තා පෙන්නුම් කරයි. ආර්ථික අර්බුදය ආරම්භයේ සිට මේ දක්වා එක්සත් රාජධානියේ ආර්ථිකය සියයට 3.3 කින් සංකෝචනය වී ඇත.

නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වර්ධනය 2013 දී සියයට 5.5 ක අගයක් ගනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇස්තමේන්තු කරයි. 2011 වසරෙහි මෙම ප්‍රතිශතය සියයට 6.3 ක් වූ අතර සංවර්ධිත රටවලින් ඇතිවන ඉල්ලුම පහළ යෑම මත මෙම රටවල අපනයන ආදායම පහළ යනු ඇත.

ක්‍රය ශක්ති සාම්‍යතාව අනුව ගණනය කරන ලද ලෝක දළ දේශීය නිෂ්පාදිතය සඳහා අඩකටත් වඩා දායක වන්නේ සංවර්ධිත රටවල් ය. ඩොලර් ට්‍රිලියන 82ක් වන ලෝක ආර්ථිකයෙහි ට්‍රිලියන 16ක් සඳහා හිමිකම් කියන්නේ බ්‍රිතාන්‍ය, ජර්මනිය හා ප්‍රංශය ඇතුළත් යුරෝපීය රටවල් ය. ඇමෙරිකා එක්සත් ජනපදයේ හිමිකම ඩොලර් ට්‍රිලියන 15.6කි. ප්‍රතිශතාත්මක වශයෙන් ගත් විට සංවර්ධිත රටවල් ලෝක දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 51.30කින් ද නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික සියයට 48.70කින් ද දායක වෙයි. ඒ අනුව ඇමෙරිකාව හා යුරෝපය ලෝක ආර්ථිකයෙන් අඩක් ම නියෝජනය කරයි. මේ නිසා මේ රටවල් මුහුණ පාන ආර්ථික පසුබෑම නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික කෙරෙහි ඇතිකරන අහිතකර බලපෑම නොවැළැක්විය හැකි ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට අපනයනවලින් සියයට 60කට ආසන්න ප්‍රමාණයක් යැවෙන්නේ ඇමෙරිකාවට හා යුරෝපයටයි. 2011 වසරෙහි අපනයන ආදායමින් සියයට 20.3 ක් ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ කළ ගනුදෙනුවලින් ද සියයට 10.5 ක් එක්සත් රාජධානිය සමඟ කළ ගනුදෙනුවලින් ද උපයා ඇත. යුරෝපා සංගමයට අයත් රටවලට කළ අපනයනවලින් සියයට 33.8ක් උපයා ඇත. එමෙන් ම 2011 වසරෙහි ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගෙන් සියයට 43ක් පමණ යුරෝපා රටවලින් පැමිණියෝ වූහ. ඒ අනුව සංචාරක කර්මාන්තයෙන් උපයන ආදායම සම්බන්ධයෙන් ද යුරෝපා රටවල ආර්ථික පසුබෑම අහිතකර ලෙස බලපානු ඇත.

**උද්ධමනය**

ලෝක බැංකු වාර්තා අනුව 2012 වසරෙහි ලෝක උද්ධමන අනුපාතය සියයට 3.9 ක් වූ අතර 2013 වසරෙහි එම අනුපාතය සියයට 3.5 - 4 මට්ටමක පවතිනු ඇත. 2012 අවසන් කාර්තුව මත පදනම්ව විමසා බලන විට සංවර්ධනය වෙමින් පවත්නා රටවල වාර්ෂික උද්ධමන අනුපාතිකය සියයට 5.1 ක් විය. මෙම අනුපාතය 2013 වසරෙහි සියයට 6.3ක් වනු ඇති බවට ලෝක බැංකුව පුරෝකථනය කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද 2013 සහ 2014 වසරවල සංවර්ධනය වෙමින් පවත්නා රටවල උද්ධමන අනුපාතය ඉහළ යනු ඇති බවට පුරෝකතනය කරයි. ඇන්ගෝලා හා නයිජීරියා ආදී අප්‍රිකානු රටවල උද්ධමන අනුපාතය සියයට 10 කටත් වඩා ඉහළ මට්ටමක පැවතිනි. නැගෙනහිර ආසියානු රටවල උද්ධමන අනුපාතය යම් ස්ථාවර මට්ටමක පවතිනු ඇතැයි පවසන එක්සත් ජාතීන්ගේ සංවිධාන වාර්තා 2012 වසරෙහි දකුණු ආසියානු රටවල සියයට 11 සාමාන්‍ය උද්ධමන අනුපාතය 2013 සහ 2014 වසරවල සියයට 10 ක් හෝ ඊට ආසන්න අගයක් හෝ ගනු ඇති බවට පුරෝකථනය කරයි. බටහිර ආසියාවේ බොහෝ රටවල අඩු උද්ධමන අනුපාතයක් පැවතිය ද යේමනයේ එය සියයට 10 කට වැඩි ප්‍රතිශයක් ගනී. ලතින් ඇමෙරිකානු රටවල උද්ධමන අනුපාතය සියයට 6 හෝ ඊට ආසන්න අගයක් ගනු ඇති බව එක්සත් ජාතීන්ගේ World Economic Situation and Prospects 2013 වාර්තාව පුරෝකථනය කරයි.

යුරෝස්ටැට් සංඛ්‍යා දත්තවලට අනුව 2013 පෙබරවාරි මස යුරෝ කලාපයෙහි උද්ධමන අනුපාතය සියයට 1.8 ක් වෙමින් යුරෝපීය මහ බැංකුවේ ඉලක්කගත උද්ධමන අනුපාතයට ද වඩා පහළ වැටී ඇත. සාමාන්‍යයෙන් අඩු උද්ධමන අනුපාතයක්

යහපත් ප්‍රවණතාවක් ලෙස සැලකෙයි. පාරිභෝගික ඉල්ලුම් තත්ත්වය ඉන් පිළිබිඹු කෙරෙයි. බොහෝ විට රැකියා වියුක්තිය ඉහළ අගයක් ගන්නා විට උද්ධමනය පහළ වැටෙනු දක්නට ලැබෙයි. ඒ අනුව ඉහළ රැකියා වියුක්තියකින් පෙළෙන යුරෝපීය ජනතාව සිය රැකියා සුරක්ෂිතතාව පිළිබඳ අවදානම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින් වියදම් අඩුකොට වැඩියෙන් ඉතිරිකිරීමට පෙළඹී සිටී.

2012 දෙසැම්බර් මස සියයට 2.3 ක් වූ යුරෝපීය සංගමයට අයත් රටවල උද්ධමනය 2013 ජනවාරි වන විට සියයට 2.1 ක් දක්වා පහළ වැටිනි. එය 2011 වර්ෂයෙහි පැවතියේ සියයට 2.9 ක්ව ය. යුරෝපා සංගමයෙහි සාමාජික රටවල් අතුරින් 2013 ජනවාරි මස ඉහළම උද්ධමන අනුපාතයක් වාර්තා වන්නේ රුමේනියාවෙනි. එය සියයට 5.1 කි. එස්තෝනියාවෙහි සහ නෙදර්ලන්තයෙහි උද්ධමන අනුපාත පිළිවෙලින් සියයට 3.7ක් සහ 3.2ක් විය. 2012 දෙසැම්බර් මාසයෙහි සියයට 0.3ක් වූ අඩුම උද්ධමන අනුපාතයක් වාර්තා වී ඇත්තේ ග්‍රීසියෙනි. ස්වීඩනයේ සියයට 1.1 ක් වූ අතර ප්‍රංශයේ සහ සයිප්‍රසයේ සියයට 1.5ක් විය.

2011 වසරෙහි එක්සත් ජනපදයෙහි සියයට 3.1 ක් වූ උද්ධමන අනුපාතය 2012 වසරේ දී සියයට 2.1ක් දක්වා පහළ බැස ඇත.

**යුරෝපය**

2012 අවසන් කාර්තුවේ යුරෝපයේ මූල්‍ය අර්බුදය තවත් බරපතල බවට පෙරළී ඇත. යුරෝ කලාපයෙහි ආර්ථිකය 2012 සිව්වන කාර්තුවේ සියයට 0.6කින් සංකෝචනය වී ඇත. කලාපයේ ආර්ථිකයේ සංකෝචනයක් ඇතිවේ යැයි අපේක්ෂා කළ ද එය අපේක්ෂා කළාටත් වඩා වූ පසුබෑමක් විය. යුරෝපයේ විශාලතම ආර්ථිකය හිමි ජර්මනියටයි. එමෙන්ම එය ලෝකයේ පස්වන විශාලතම ආර්ථිකයයි. යුරෝපා සංගමයට අයත් රටවල් අතුරින් ශක්තිමත් ම ආර්ථිකය හිමි ද ජර්මනියටයි. එහෙත් කලාපයේ නිමවුමෙන් ¼ ක් නිෂ්පාදනය කරන ජර්මන් ආර්ථිකය ද මේ වන විට මුහුණ දී ඇති තත්ත්වය එතරම් යහපත් නොවේ. 2011 වසරෙහි එරට ආර්ථික වර්ධනය සියයට 3.1 ක් වූ අතර 2012 හි එය සියයට 0.9 ක් දක්වා පහළ වැටී ඇත. 2013 වසරෙහි ආර්ථික වර්ධනය සියයට 0.6 ක් දක්වා තවදුරටත් පහළ වැටෙනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරයි. ජර්මන් මහ බැංකුව පුරෝකථනය කරන පරිදි 2013 වසරෙහි ආර්ථික වර්ධනය සියයට 0.4ක් දක්වා පහළ වැටෙනු ඇතැයි අපේක්ෂිත ය. ජර්මන් ෆෙඩරල් සංඛ්‍යා ලේඛන කාර්යාලයට අනුව 2012 අවසන් කාර්තුවේ ජර්මන් ආර්ථිකය සියයට 0.5 කින් සංකෝචනය විය. මෙම තත්ත්වයට හේතුවූයේ අපනයනවල පහළ යෑම බව එම ආයතනය පවසයි. 2012 අවසන් කාර්තුවේ ආනයන භාණ්ඩවලට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අපනයන පහළ වැටී ඇති බැව් වාර්තා වෙයි. කෙසේ වෙතත් එරට ප්‍රධාන අර්ථ ශාස්ත්‍රඥයෙකු වන ඇන්ඩ්‍රියාස් රීස් (Andreas Rees) පවසන්නේ ජර්මන් ආර්ථිකයේ ඇතිවූයේ තාවකාලික පසුබෑමක් බවයි. ඒ අනුව මෙම පසුබෑම යථා තත්ත්වයට පත් වේ යැයි අපේක්ෂා කෙරේ. ස්පාඤ්ඤය, ඉතාලිය, ග්‍රීසිය හා පෘතුගාලය වැනි යුරෝපා කලාපයේ අවට රටවල ආර්ථිකවල සිදුවූ සීඝ්‍ර පසුබෑම් හා සාපේක්ෂව ගත් විට එතෙක් ජර්මනිය යුරෝපා ආර්ථිකයේ යම් කැපී පෙනෙන මට්ටමක පැවතිනි.

ස්පාඤ්ඤ බැංකු වාර්තා අනුව 2012 හතරවන කාර්තුවේ එරට ආර්ථිකය සියයට 0.6 කින් සංකෝචනය විය. 2011 වසරෙහි එරට අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9ක් විය. එය 2012 වසරෙහි සියයට 6.3 ක් දක්වා අඩුකිරීමට අපේක්ෂා කරන ලද අතර 2013 වසරෙහි බදු ඉහළ දැමීම හා වියදම් කපා හැරීම මගින් අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක් දක්වා අඩු කිරීමට සැලසුම් කර ඇත.

**02 වන සංඛ්‍යා සටහන**

| ලෝක වෙළෙඳ පරිමාව (වෙනස්වීමේ ප්‍රතිශතය) | | | | |
|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013* | 2014* |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ සහ සේවා)** | 5.9 | 2.8 | 3.8 | 5.5 |
| **ආනයන** | | | | |
| සංවර්ධිත ආර්ථික | 4.6 | 1.2 | 2.2 | 4.1 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික | 8.4 | 6.1 | 6.5 | 7.8 |
| **අපනයන** | | | | |
| සංවර්ධිත ආර්ථික | 5.6 | 2.1 | 2.8 | 4.5 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික | 6.6 | 3.6 | 5.5 | 6.9 |

*පුරෝකථන

**මූලාශ්‍රයඃ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - World Economic Outlook Update**

2012 අවසන් කාර්තුවෙහි ප්‍රංශ ආර්ථිකයෙහි ද පසුබෑමක් දක්නට ලැබුණි. එම කාර්තුවෙහි ආර්ථිකය සියයට 0.3 කින් සංකෝචනය විය. කෙසේ වෙතත් එරට මහ බැංකු පුරෝකථන අනුව 2013 මුල් කාර්තුවේ ආර්ථික වර්ධනයේ යම් ප්‍රගතියක් පෙන්වනු ඇත. ආර්ථික පසුබෑමට ලක්ව ඇති මෙම රටවල් තම තමන්ගේ රටවල ආර්ථික යථා තත්ත්වයට ගෙන ඒමට විවිධ පියවර ගනිමින් සිටී. ප්‍රංශ ජනාධිපති එරට ආර්ථිකය තරඟකාරිත්වය තුළින් යථා තත්ත්වයට ගෙන ඒමට උත්සාහ දරද්දී ඉතාලි රජය ලිහිල්කරණ ප්‍රතිපත්ති මඟින් ආර්ථිකය යථා තත්ත්වයට ගෙන ඒමට උත්සාහ දරනු දක්නට ලැබේ. එමෙන් ම අපනයන ආදායම් තරකර ගනු වස් තම තමන් ගේ මූල්‍ය ඒකක පහළ දැමීමක් ද කරනු දක්නට ලැබේ. එය මූල්‍ය යුද්ධයකට හේතු වනු ඇතැයි ප්‍රතිපත්ති සම්පාදකයෝ පෙන්වා දෙති.

පොදුවේ ගත් විට ආර්ථික අර්බුදයට මුහුණ පෑ රටවල නිෂ්පාදන කර්මාන්තය බෙහෙවින් පසුබෑමට ලක්ව ඇත. මෝටර් රථ සමාගම්, ගුවන් සේවා සමාගම් වැනි විශාල පරිමාණයේ ආයතන අලාභ ලබන ඒවා බවට පත්ව ඇත. ඇතැම් කර්මාන්තශාලා වැසී යමින් පවතී. ඇතැම් අවස්ථාවල අලාභ ලබන සමාගම් ඒකාබද්ධ කරනු දක්නට ලැබෙයි. සේවකයින් රැකියාවලින් ඉවත් කිරීම් මෙන් ම සේවක සංඛ්‍යාව අඩුකරනු ලබයි. වැඩකරන පැය ගණන් සීමා කරනු ලබයි.

ආර්ථික පසුබෑස්ම හමුවේ බොහෝ රටවල අයවැය පරතරය හා ණය බර පුළුල්වෙමින් පවතී. එමෙන් ම වෙළෙඳ පරිමාව අඩුවෙමින් පවතී. (02 වන සංඛ්‍යා සටහන)

02 වන සංඛ්‍යා ලේඛනය අනුව සංවර්ධිත ආර්ථික සහ නැගී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් යන කාණ්ඩ ද්වයෙහි ම ආනයන අපනයන පරිමාවල පහළ යෑමක් දක්නට ලැබෙයි. මේ නිසා අර්බුදය නිරාකරණය සඳහා ගත යුතු පියවර ඒ ඒ රටවල ආර්ථික මත පමණක් නොව පොදුවේ ලොව ආර්ථික රැසක් මත විවිධාකාරයෙන් බලපානු ඇත.

අර්බුදයට උග්‍ර ලෙස මැදිවී සිටින රටවලට ඒවායේ ආර්ථික යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වරින් වර ණය මුදල් ලබා දෙයි. ඒ අනුව 2013 ජනවාරි මස මූල්‍ය අරමුදල විසින් ග්‍රීසියට ඩොලර් බිලියන 4.3ක ණය මුදලක් අනුමත කරන ලදි. 2010 සහ 2011 වසරවල ග්‍රීසියෙහි රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 144.5ක් සහ 165 ක් වූ අතර 2012 වසරෙහි මෙම ප්‍රතිශතය සියයට 170.7 ක් ලෙස ද 2013 සියයට 181 .8 ක් වනු ඇති බවට ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරයි. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ණය පරිමාවෙහි ඉහළම ප්‍රතිශතයක් වාර්තාවන්නේ ජපානයෙනි. එය ජපන් ආර්ථිකය මෙන් දෙගුණයකටත් වඩා විශාලය. මෙම වසරෙහි එම ප්‍රතිශතය සියයට 245 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

**ඉහළ යන රැකියා වියුක්තිය**


ලෝක ආර්ථිකයෙහි ඇතිවන පසුබෑමෙහි ප්‍රතිඵල ලෙස ඉතාමත් ම ඛේදජනක සමාජ ප්‍රශ්නයක් ලෙස ඉස්මතුව ඇත්තේ දිනෙන් දින ඉහළ යන රැකියා වියුක්තිය යි. ආර්ථික පසුබෑම හමුවේ ව්‍යාපාර ආයතන වැසී යමින් පවතී. රැකියා, වැටුප් හා විශ්‍රාම වැටුප් ආදිය කප්පාදු කරමින් පවතී. මෙම ක්‍රියාමාර්ග ජන ජීවිතය නොසන්සුන්තාවයට පත්කරයි. සහනය පතා කෙරෙන ඉල්ලීම්, උද්ඝෝෂණ හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා බවට පෙරළෙමින් පවතී. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වාර්තා අනුව 2013 වසරෙහි ලොව පුරා මිලියන 202 ජනගහනයක් රැකියා විරහිතව සිටිනු ඇත. එක්සත් ජාතීන්ගේ ඒජන්සි වාර්තා අනුව ශ්‍රම හමුදාවෙන් සියයට 6ක් රැකියා විරහිතව සිටී. 2012 වසරෙහි රැකියා වියුක්ති ජනගහනය මිලියන 4 කින් වැඩි වෙමින් මිලියන 197 ක් දක්වා වර්ධනය විය. තරුණ ජනගහනය කෙරෙහි මෙහි බලපෑම ඉතාමත් ම අහිතකරය. ලොව අවුරුදු 24 ට අඩු ජනගහනයෙහි රැකියා වියුක්තිය සියයට 13 කි. ලෝකයේ විශාලතම ආර්ථිකවල (ජී 7 රටවල) මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙම තත්ත්වය වඩාත් උග්‍රකරන බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය පවසයි. 2008 හා 2009 පැවති අර්බුද සමය හා සැසැඳීමේ දී ජී 20 රටවල මුදල් ප්‍රතිපත්ති හා අයවැය ප්‍රතිපත්තිවල තාර්කික බව නැතිවී ඇත. එම නිසා යථා තත්ත්වයට පත්වීමට හා අවිනිශ්චිතතාවෙන් මිදීමට ඒවා උපකාරී නොවන බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය පවසයි.

යුරෝ ස්ටැට් සංඛ්‍යා ලේඛනවලට අනුව 2012 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වන විට යුරෝ කලාපයෙහි මිලියන 18.998 ජනගහනයක් රැකියා විරහිතව සිටියහ. මෙය එම කලාපයෙහි ශ්‍රම හමුදාවෙන් සියයට 11.8 ක් පමණ වේ. එය 1999 පොදු මුදල් ඒකකයක් භාවිතය ඇරඹි පසු වාර්තා වූ ඉහළ ම රැකියා වියුක්තියයි. 2013 ජනවාරි මාසයෙහි මෙම ප්‍රතිශතය සියයට 11.9ක් දක්වා ඉහළ නැගිනි. එසේ ඉහළ නැගුනේ දෙසැම්බර් මාසයට වඩා මිනිසුන් 201,000ක් රැකියා විරහිත වූවන්ගේ ගොන්නට ඇද වැටෙමිනි. එය පෙර වර්ෂයේ පැවති තත්ත්වය හා සැසඳීමේ දී සියයට 1.2 ක ඉහළ යෑමකි. ඉහළම රැකියා වියුක්ති අනුපාතයක් වාර්තා වන්නේ ග්‍රීසියෙන් සහ ස්පාඤ්ඤයෙනි. 2012 නොවැම්බර් මාසයෙහි ග්‍රීසියෙන් වාර්තා වූ රැකියා වියුක්ති අනුපාතය සියයට 27ක් විය. (2012 දෙසැම්බර් සහ 2013 ජනවාරි සඳහා ග්‍රීසියෙහි රැකියා වියුක්තිය සම්බන්ධ දත්ත යාවත්කාලීන කර නොතිබිණි.) 2011 සැප්තැම්බරයේ ග්‍රීසියේ රැකියා වියුක්ති අනුපාතය සියයට 18.9 ක් ව පැවතිණි. ස්පාඤ්ඤයේ 1970 මැද භාගයට පසු වාර්තා වූ ඉහළම රැකියා වියුක්තිය 2012 නොවැම්බරයේ වාර්තා විය. එය සියයට 26.2 ක් විය. ස්පාඤ්ඤ ජාතික සංඛ්‍යා ලේඛන ආයතනයට අනුව පසුගිය වසරෙහි එරට මිලියන 5.97 ක ජනගහනයක් රැකියා වියුක්තව සිටියහ. 2013 ජනවාරි මාසයේ එ රටින් වාර්තා වූ රැකියා වියුක්ති අනුපාතය සියයට 26.2ක් තරම් ඉහළ අගයක් ගත්තේ ය. (03 වන රූප සටහන) රැකියා කප්පාදුවට එරෙහිව ස්පාඤ්ඤයෙහි මහජන විරෝධතා රැසක් පැන නැගී ඇති

**03 වන රූප සටහන**

**කාලීනව ගලපන ලද රැකියා වියුක්ති අනුපාතය**

**2013 ජනවාරි**




**මූලාශ්‍රයඃ යුරෝස්ටැට්**

අතර ඇතැම් අවස්ථාවල ඒවා ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගනු දක්නට ලැබෙයි. 2013 ජනවාරි මාසයෙහි පෘතුගාලයෙහි රැකියා වියුක්තිය සියයට 17.6 ක් ලෙස වාර්තා වෙයි. එය 2012 ජනවාරි මාසයෙහි සියයට 14.7 ක් විය.

යුරෝපා සංගමයට අයත් රටවල් 27 සමස්තයක් ලෙස ගත් විට 2012 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල රැකියා වියුක්ති අනුපාතය සියයට 10.7 මට්ටමේ රැඳී තිබිණි. එහෙත් 2013 ජනවාරි වන විට සියයට 10.8ක් දක්වා ඉහළ නැග ඇති බැව් යුරෝ ස්ටැට් සංඛ්‍යා දත්ත පෙන්නුම් කරයි. පෙර මාසයට වඩා මිනිසුන් 222,000 රැකියා වියුක්ත ජනගහනයට එක්වෙමින් ජනවාරි මස මිලියන 26.217 ක ජනගහනයක් එම රටවල් සමූහයෙහි රැකියා විරහිතව සිටිය හ. 2011 නොවැම්බර් මාසයෙහි රැකියා විරහිතව සිටි ජනගහනය හා සසඳා බලන විට එය මිලියන 2.012ක වැඩිවීමක් පෙන්නුම් කරයි. වසර 2000 ට පෙර යුරෝපා සංගමයට අයත් රටවල රැකියා වියුක්ති අනුපාතය සියයට 9 ක් විය. ඒ අනුව මිලියන 20 ජනගහනයක් රැකියා වියුක්තව සිටියේ ය. 2001 දී රැකියා වියුක්ති අනුපාතය සියයට 8.5ක් දක්වා පහළ වැටිණි. ඒ අනුව එම වසරෙහි රැකියා රහිතව සිටි ජනගහනය මිලියන 19 ක් විය. 2002 මෙම සංඛ්‍යාව මිලියන 21 දක්වා ඉහළ නැගුන අතර 2005 මැද භාගය තෙක් ම එය එම මට්ටමේ ම රඳා පැවතියේ ය.

යුරෝපා සංගමයෙහි සාමාජික රටවල් අතුරින් අඩුම රැකියා වියුක්තියක් වාර්තා වන්නේ ඔස්ට්‍රියාවෙනි. එය සියයට 4.9 කි. ජර්මනියේ සහ ලක්සම්බර්ග් හි සියයට 5.3 කි. නෙදර්ලන්තයේ සියයට 6.0 කි. සංගමයට අයත් රටවල් 27 න් පෙර වර්ෂයට සාපේක්ෂව රටවල් 20 ක රැකියා වියුක්ති අනුපාතය ඉහළ ගොස් ඇත. රටවල් 6 ක රැකියා වියුක්ති අනුපාතය පහළ වැටී ඇති අතර ඩෙන්මාර්කයේ 7.4 ක් ලෙස ස්ථාවරව පැවතිනි. විශාලතම පහළ වැටීම වාර්තා වන්නේ එස්තෝනියාවෙනි. 2011 දෙසැම්බර් මාසයෙහි එරට රැකියා වියුක්ති අනුපාතය සියයට 11.1 ක් ව තිබුණු අතර 2012 දෙසැම්බරයේ එය සියයට 9.9ක් දක්වා පහළ වැටී ඇත.

රැකියා වියුක්තියෙහි ඉහළ යෑම පිළිබඳව විමසා බලන විට දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් තරුණ පිරිස් අතර රැකියා වියුක්තියෙහි ඉහළ යෑමයි. 2013 ජනවාරි මස යුරෝපා සංගමයට අයත් රටවල අවුරුදු 25 ට අඩු තරුණ ජනගහනයෙන් සියයට 23.6 ක්, එනම් මිලියන 5.732 ක් රැකියා වියුක්තව සිටිය හ. 2012 ජනවාරියෙහි මෙම අනුපාතය සියයට 22.4ක් විය. එමෙන් ම යුරෝ කලාපයට අයත් රටවල 2012 ජනවාරියේ සියයට 21.9ක් වූ තරුණ ජනගහනයෙහි රැකියා වියුක්තිය 2013 ජනවාරි වන විට සියයට 24.2ක් දක්වා ඉහළ නැග තිබේ. ඒ අනුව මේ වසර ආරම්භයේ තරුණ ජනගහනය මිලියන 3.642 ක් යුරෝ කලාපයෙහි රැකියා වියුක්තව සිටියහ.

තරුණ ජනගහනයෙහි ඉහළම රැකියා වියුක්තිය වාර්තා වන්නේ ග්‍රීසියෙනි. එය 2012 නොවැම්බර් මාසයෙහි සියයට 59.4ක් තරම් ඉහළ අගයක් ගත්තේ ය. ස්පාඤ්ඤයේ හා ඉතාලියේ මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 55.5ක් හා 38.7ක් ලෙස වාර්තා වෙයි. 2013 ජනවාරි මාසයේ තරුණ ජනගහනය අතර අඩුම රැකියා වියුක්තිය වාර්තා වන්නේ ජර්මනියෙනි. එය සියයට 7.9 කි. ඔස්ට්‍රියාවේ හා නෙදර්ලන්තයේ එම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 9.9 ක් සහ 10.3 ක් වේ.

**අතුරු ඵල**

රැකියා වියුක්ති අනුපාතය රටක සමාජ හා ආර්ථික තත්ත්වය මැනීමේ දර්ශකයක් ලෙස භාවිතයට ගැනෙයි. රැකියා වියුක්තිය ඉහළ යෑම තුළින් පුද්ගලික ආදායම පහළ වැටීම, යැපෙන්නන් සංඛ්‍යාව ඉහළ යෑම, ජීවන තත්ත්වය පහළ වැටීම, පරිභෝජන වියදම් වැඩිවී එය ඉතුරුම් අඩුවීමටත් ඒ ඔස්සේ ආයෝජන අඩුවීමටත්, රැකියා නොමැතිකමින් අසහනයෙන් පෙළෙන්නන් සමාජ විරෝධී හා නීති විරෝධී ක්‍රියාවලට පෙළඹීම ඉහළ යෑම, ආර්ථිකයට ඵලදායී යමක් එකතු නොකරන පිරිසක් වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවීමෙන් රජයේ වියදම් ඉහළ යෑම, බදු ආදායම පහළ යෑම හා බදු ගෙවන්නන් මත අතිරේක බදු බරක් පැටවීම යනාදිය සිදු වෙයි.

එමෙන්ම ආදායම් මාර්ග බිඳ වැටීමෙන් පාරිභෝගිකයන්ගේ භාණ්ඩ මිලදී ගැනීමේ ශක්තිය අඩුවෙයි. ඉල්ලුම අඩුවීමත් සමඟ කර්මාන්තශාලාවලට සිය නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට නොහැකි වෙයි. එම ආයතන අලාභ ලබන තත්ත්වයට පත්වීමෙන් එම ආයතනවල සේවකයන්ගේ රැකියා සම්බන්ධයෙන් අවිනිශ්චිතතා මතුවේ.

මේ වනවිට රැකියා විරහිතභාවය හා සමාජ නොසන්සුනාවයෙහි අතුරු පල ලෙස යුරෝපා රටවල සිය දිවි නසා ගැනීම් අනුපාතය ද ඉහළ යමින් පවතී. යුරෝ ස්ටැට් සංඛ්‍යා දත්ත අනුව රැකියා වියුක්ති අර්බුදය ඇරඹීමට පෙර යුරෝපයේ රටවල් අතුරින් අඩුම සියදිවි නසාගැනීම් ප්‍රමාණයක් වාර්තාවූයේ ග්‍රීසියෙනි. එය පුද්ගලයන් 100,000: 2.8 ක් විය. එහෙත් දැන් මෙම තත්ත්වය දෙගුණයක් බවට පෙරළී ඇත. ග්‍රීක සෞඛ්‍ය අමාත්‍යාංශ අධ්‍යයනයකට අනුව 2011 මුල් භාගයේ සිය දිවි නසා ගැනීම් අනුපාතය පෙර වසරට වඩා සියයට 40කින් වැඩි වී ඇත. ආර්ථික අර්බුදයට මුහුණපා සිටින අනෙකුත් යුරෝපා රටවල ද සිය දිවි නසාගැනීම් ඉහළ යමින් පවතී.

**ලුහුඬින්....**

2008 වසරෙහි පටන් ඇමෙරිකා එක්සත් ජනපද සහ යුරෝපා ආර්ථිකවල ඇතිවූ ආර්ථික අර්බුදය විසින් ලෝක ආර්ථිකය තව දුරටත් පසුබෑමට ලක්කරමින් සිටී. එය යථා තත්ත්වයට පත් වේ යැයි අපේක්ෂා කළ ද එය සිදුවන්නේ ඉතාමත් ම මන්දගාමීවය. මේ සම්බන්ධව ගතයුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සංවර්ධිත රටවල් විසින් ජයගත යුතු අභියෝග දෙකක් පිළිබඳව සඳහන් කරයි.

1. ස්ථාවර සහ දිගු කල් පවත්නා ශක්තිමත් මූල්‍ය පදනමක් දැමීම

2. මූල්‍ය ක්‍රමයේ අවදානම් අඛණ්ඩව අඩුකිරීමට මූල්‍ය ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම

මෙම අභියෝග ජයගැනීම තුළින් පසුබෑසීම් අවදානම් අඩුකරගත හැකි අතර ආර්ථික යළි යථා තත්ත්වයට පත්කර ගතහැකි බැව් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවසයි.✪

# ශ්‍රී ලංකාවේ
# උකස් නීතිය පිළිබඳ
# හැඳින්වීමක්

**තරංග විජයකෝන්**

සහකාර අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

උකස් යන්න අපට එදිනෙදා ජීවිතයේ දී වැදගත් වන නීතිමය සංකල්පයකි. අප මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමේ දී ඇපයක් ලෙස දේපළ උකස් කරන අතර, මුදල් හදිසියක දී රන් භාණ්ඩ උකස් කර ණය මුදල් ලබා ගැනීම ද සිදුකරයි. මේ අනුව උකස් සම්බන්ධයෙන් අදාළ වන නීතිමය තත්ත්වය පිළිබඳව දැනුම්වත් වීම ඉතාමත් වැදගත් වේ.

දේපළ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකියි.
එනම්,

1. නිශ්චල දේපළ

2. චංචල දේපළ

උකස් සම්බන්ධ නීති මෙම කොටස් දෙක යටතේ සලකා බැලිය හැක.

### 1. නිශ්චල දේපළ

නිශ්චල දේපළ උකස් කිරීම සම්බන්ධයෙන් බලපාන ප්‍රධාන නීතිය 1949 අංක 6 දරන උකස් පනතයි. උකස් පනතෙහි උකසක් (Mortgage) යන්න අර්ථ දක්වා තිබේ. ඒ අනුව උකසක් යනු යම් මුදලක් හෝ මුදල්මය වටිනාකමක් ඇති දෙයක් හෝ වෙනුවෙන් ඇපයක් ලෙස යම් දේපළක් කෙරෙහි ඇති වන අයිතිවාසිකමකි.

නිශ්චල දේපළ පිළිබඳව උකසකට එළඹීමේ දී වැදගත් වන ප්‍රතිපාදනයක් වංචා වැළැක්වීමේ ආඥා පනතේ 2 වන වගන්තියේ දැක්වේ. එනම්, එවැනි උකසක් නීතිය ඉදිරියේ වලංගු වීමට එය ලිඛිතව විය යුතු අතර එයට එළඹෙන පාර්ශ්වය නොතාරිස්වරයකු හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ එයට අත්සන් තැබිය යුතු ය. ඒ බවට නොතාරිස්වරයා හා සාක්ෂිකරුවන් එම ඔප්පුවේ ලියා සහතික කළ යුතු ය. ඊට අමතරව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 8 වන වගන්තියට අනුව නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන උකස් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. මෙසේ ලියාපදිංචි කිරීමෙන් එම ලේඛනයට, එයට පෙර සකස් කරන ලද ලියාපදිංචි නොකරන ලද ලේඛනයකටත්, එයට පසුව සකස් කර ලියාපදිංචි කරන ලේඛනයකටත් එරෙහිව ප්‍රමුඛතාවක් ලැබේ.

ඉහත ප්‍රතිපාදන අනුව සකස් කර ලියාපදිංචි කරන ලද උකසක් බලාත්මක කළ හැකි ආකාරය පිළිබඳ කාර්යපටිපාටිය උකස් පනතේ දක්වා ඇත. මෙම කාර්යපටිපාටිය ප්‍රධාන කොටස් 3 කට බෙදිය හැක. එනම්,

(අ) උකස බලාත්මක කිරීම සඳහා නඩු පැවරීම

(ආ) නඩුව පවත්වාගෙන යන අතරතුර පැන නගින කරුණු

(ඇ) නඩුව අවසානයේ දී අදාළ දේපළ විකිණීම

**(අ) උකස බලාත්මක කිරීම සඳහා නඩු පැවරීම.**

උකසක් බලාත්මක කිරීමට පවරන නඩුවක් එම උකසට අදාළ මුදල් නැවත අයකර ගැනීමට අදාළ නඩුවක් (Money Recovery Action) සමඟ එකට හෝ වෙන් වෙන්ව හෝ පැවරිය හැකිය.

උකස් නඩුවක් පැවරීමට පෙර නීතිඥයකු විසින් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දේපළට සම්බන්ධ ලේඛන ලියාපදිංචි කර ඇති ගොනුවෙහි 'ලිස් පෙන්ඩන්ස්' ලෙස හැඳින්වෙන දැන්වීමක් ලියාපදිංචි කළ යුතුයි. මෙය ලියාපදිංචිය මගින් අදාළ දේපළ සම්බන්ධයෙන් උකස් නඩුවක් පවතින බව එම දේපළ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අදාළ ගොනුව

පරීක්ෂාවෙන් දැන ගැනීමට ලැබීමත්, එම නඩුව සම්බන්ධයෙන් නොතිසි ලැබිය යුතු පාර්ශ්වයන්ට නොතිසි ලැබීමට සැලැස්වීමත් සහතික කෙරේ.

**(ආ) නඩුව පවත්වාගෙන යන අතරතුර පැන නගින කරුණු**

නඩුව පවත්වාගෙන යන අතරතුර නඩුවේ පාර්ශ්වකරුවෙකු මිය ගියහොත්, මියගිය තැනැත්තාගේ දේපළ සම්බන්ධයෙන් ප්‍රොබෙට් බලපත්‍රයක් හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් හෝ නිකුත් කරනු ලැබිය හැකි පුද්ගලයෙකු මියගිය පුද්ගලයාගේ අයිතිවාසිකම් නියෝජනය කිරීම සඳහා අධිකරණය විසින් පත් කළ හැක.

යම් දේපළක් සඳහා උකස් නඩුව පවත්වාගෙන යන අතරතුර එම ඉඩම ආරක්ෂාව, කළමනාකරණය හා සංරක්ෂණය යන කරුණු සඳහා ලැබුම්කරුවෙකු (Receiver) පත් කිරීමේ බලයක් අධිකරණයට ඇත.

**(ඇ) නඩුව අවසානයේ දී අදාළ දේපළ විකිණීම**

උකස් බලාත්මක කළ යුතු බවට අධිකරණය තීන්දු කළහොත් උකසට යටත් දේපළ විකිණීමට නියෝග කරනු ලැබේ. එම විකිණීම කළ යුත්තේ කවුරුන් විසින් ද, ඒ සඳහා දැන්වීම් පළ කරන අයුරු, විකිණීමට අදාළ කොන්දේසි හා ඒ හා බැඳුනු අනුෂංගික කරුණු පිළිබඳ නියෝග ලබාදීමේ බලයක් අධිකරණයට ඇත. දේපළ විකිණීම තීන්දු ප්‍රකාශයෙන් මාස දෙකක් ඇතුළත හෝ අධිකරණය විසින් නියම කරන වැඩිමනත් කාලයක් තුළ හෝ සිදුකළ යුතුය.

උකස් පනතට අනුව උකස් කළ දේපළ හැර වෙනත් දේපළක් උකස යටතේ අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා විකිණිය නොහැක.

කෙසේ වෙතත් උකස් පනතේ 47 අ වගන්තියෙන් මෙයට ව්‍යතිරේඛයක් පනවා ඇත. එනම් ණයට දෙන ආයතනයකට උකස් කිරීමක් කරන විට, ණය මුදල රු. 150,000/- ඉක්මවන්නේ නම් එම උකස් ඔප්පුව සමගම නොතාරිස් කෙනෙකු විසින් ලියා සහතික කරන ලද වෙනත් ඔප්පුවක් මගින් ඉහත දැක්වූ අයිතිය අත හරින බවටත්, එකී පලවිපාක තමන්ට පහදා දී ඇති බවටත් ප්‍රකාශයක් උකස්කරුට කළ හැක. කෙසේ වෙතත් මෙම ප්‍රකාශය ලබා ගැනීමේ අයිතිය ඇත්තේ,

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු

(ආ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

(ඇ) ජාතික සංවර්ධන බැංකුව

(ඈ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව

(ඉ) ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව යන ණය දෙන ආයතනවලට පමණි.

උකස්කරුගේ වෙනත් දේපළ විකිණිය හැකි වන්නේ මුලින් උකස් කළ දේපළ විකුණා එම විකිණීමෙන් ලද මුදල නඩුවේ තීන්දු ප්‍රකාශය සපුරාලීම සඳහා යෙදවීමෙන් පසුව පමණි.

දේපළ විකිණීමට පෙර දැනට එහි පදිංචිව සිටින අයගෙන් අත්පත් කරගත යුතු නම් එය අධිකරණයේ පිස්කල්වරයා හරහා සිදුකළ හැකි අතර, එසේ අත්පත් කරගත් අවස්ථාවක දී විකිණීම සිවිල් නඩු විධාන සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන අනුව සිදුකළ යුතුය.

නිශ්චල දේපළක් ඇපයට තබා ඇති කරන ප්‍රථම උකස, ප්‍රාථමික උකසක් යනුවෙන් හඳුන්වන අතර එයට පසුව එම දේපළ ඇපයට තබා ඇති කරන උකස් ද්විතියික උකස් යනුවෙන් හැඳින්වේ. යම් ද්විතියික උකසකට යටත් ඉඩමක් උකස් පනතේ ප්‍රතිපාදන අනුව විකුණන විටක දී ද්විතියික උකස් හිමියෙකුට හිමි වන්නේ ප්‍රාථමික උකස් හිමියාට ලැබිය යුතු මුදල් බේරීමෙන් පසු ලැබෙන මුදලක් පමණි.

උකස් නඩුවක පැමිණිලිකරුවෙකුට උකස් දේපළක් මිල දී ගැනීමට හෝ ඒ සඳහා ලංසු තැබීමට හෝ හැක්කේ ඒ සඳහා අධිකරණය විසින් අවසර ලබා දුනහොත් පමණි.

**බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත**

මෙතෙක් අප සාකච්ඡා කළේ සාමාන්‍ය නීතිය යටතේ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ උකසක් බලාත්මක කළ හැකි ආකාරය පිළිබඳවයි. කෙසේ වෙතත්

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු

(ආ) ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව

(ඇ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව

යන බැංකුවලට බලපාන විශේෂ නීතිමය ප්‍රතිපාදන 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පනවා ඇත.

මේ අනුව බැංකුවක් මගින් දේපළ උකසක් මත ණය මුදලක් ලබා දී ඇත්නම්, එම ණය ආපසු ගෙවීම පැහැර හරින ලද විටක දී, එම බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයට එහි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය හැක. ඒ අනුව මෙම ආයතනවලට උකසක් බලාත්මක කිරීම සඳහා අධිකරණයේ නඩු පැවරීමක් අවශ්‍ය නොවේ. මෙසේ නඩු නොපවරා උකස් දේපළ විකිණීම 'පරාටෙ බලාත්මක කිරීම' ලෙස හැඳින්වේ. තවද, උකස් දේපළ මිල දී ගන්නාට අයිතිකරුවෙකු සතු සියලු බලතල පැවරෙන ලෙස විකිණීමේ

සහතිකයක් නිකුත් කිරීමේ බලය ද ඉහත පනත යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි වේ.

මෙම විශේෂ විධිවිධාන පනතේ ප්‍රතිපාදන බලපත්‍රලාභී මුදල් සමාගම්වලට ද අදාළ කළ හැකිදැයි සලකා බැලීම කාලෝචිත වේ. මෙමගින් එම සමාගම් උකස් බලාත්මක කිරීමට වැයවන ධනය, කාලය හා ශ්‍රමය ඉතිරි කර ගැනීමට හැකිවනු ඇත. කෙසේ වෙතත් මුදල් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල මෙම පනතින් ලැබෙන බලතල වගකීමකින් යුතුව භාවිතා කරනු ඇත්දැයි යන්න ද සලකා බැලිය යුතුය.

කෙසේ වෙතත් වර්තමානයේ දී මුදල් සමාගම් උකස් ගිවිසුම්වලට එළඹීම වෙනුවට ණය මුදල හා පොලිය ගෙවූ විට ණයකරුට ආපසු පැවරීමේ පොරොන්දුව පිට අදාළ දේපළ තමන් වෙත පවරා ගැනීම සිදු කරයි. මෙයින් උකස් ගිවිසුමකට එළඹීමේ හා උකස බලාත්මක කිරීමේ වියදම හා ශ්‍රමය මගහරවා ගැනීමට මුදල් සමාගම් කටයුතු කරයි. කෙසේ වෙතත් මෙම ක්‍රියාදාමයේ දී ණයකරුට උකස් පනතින් හිමිවන රැකවරණය අහිමි වන අතර මුදල් සමාගම විසින් දේපළ ආපසු පවරා දීම පිළිබඳව නීතිය ඉදිරියේ පිළිගත හැකි සහතිකයක් නොලැබීමෙන් නීතියේ රැකවරණය ලැබීමට ඇති හැකියාවත් අහිමි වේ.

**2. චංචල දේපළ**

මෙතෙක් අප සලකා බැලුවේ නිශ්චල දේපළට අදාළ වන උකස් නීතියයි. චංචල දේපළ සම්බන්ධයෙන් අදාළ වන නීති තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. මෙයට හේතුව චංචල දේපළ සම්බන්ධයෙන්,

(අ) 1949 අංක 6 දරන උකස් පනත

(ආ) 1942 අංක 13 දරන උකස් ගන්නන්ගේ ආඥා පනත

(ඇ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කර ඇති 1998 බලපත්‍රලාභී වාණිජ බැංකු (උකස්) කොන්දේසි

(ඈ) පළාත් සභා විසින් නිකුත් කළ හැකි ප්‍රඥප්තීන් යන නීති/රීති වලින් එකක් හෝ කිහිපයක් හෝ අදාළ විය හැකි බැවිනි.

සිංහල භාෂාවෙන් "උකස්" යන වචනය ඉංග්‍රීසි භාෂාවේදී "Mortgage" හා "Pawn" ලෙස හැඳින්වෙන ගනුදෙනු වර්ග දෙකක් හැඳින්වීමට භාවිතා කෙරේ. එම නිසා ඉහත "Mortgage" හා "Pawn" අතර වෙනස්කම සලකා බැලිය යුතුය.

Pawn සම්බන්ධයෙන් අදාළ වන්නේ උකස් ගන්නන්ගේ ආඥා පනතයි. එම ආඥා පනතේ Pawn යන්න අර්ථ දක්වා නැත. නීති ශබ්දකෝෂවල Pawn යන්න යම් ණය මුදලකට ඇපයක් ලෙස චංචල දේපළක් තැන්පත් කිරීම ලෙස හඳුන්වා දී ඇත.

සාමාන්‍ය උකසක දී නිශ්චල හෝ චංචල හෝ දේපළ උකස් හිමියාගේ සන්තකයේ තැන්පත් කිරීම අත්‍යාවශ්‍ය නොවේ. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 17 වන වගන්තියට අනුව චංචල දේපළ උකස් කිරීම නීතිය ඉදිරියේ බලාත්මක වීමට නම්,

(අ) එම උකස ලිඛිත ලේඛනයක් ලෙස උකස් කර, සකස් කිරීමෙන් දින 21 ක් ඇතුළත අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීම හෝ

(ආ) අදාළ චංචල දේපළ උකස් හිමියාගේ සන්තකයට භාර කිරීම හෝ සිදුකළ යුතුය.

මේ අනුව Pawn ලෙස හැඳින්විය හැක්කේ යම් චංචල දේපළක් ඉහත දෙවන ක්‍රමයට උකස් කිරීමක් වේ.

උකස් ගන්නන්ගේ ආඥා පනතට අනුව බලපත්‍රයක් නොමැතිව යම් තැනැත්තෙකුට භාණ්ඩ උකස් ගැනීමේ ව්‍යාපාරයෙහි (Business of a Pawn Brokers) නිරත විය නොහැක. වර්තමානයේ මෙම බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ය.

එම ආඥා පනතට අනුව භාණ්ඩයක් උකස් කිරීමේ දී උකස් සීට්ටුවක් ලබාදීම අනිවාර්ය වන අතර, එම සීට්ටුව ඉදිරිපත් කිරීමෙන් උකස් භාණ්ඩය බේරාගත හැක. උකස් කළ භාණ්ඩයක් උකස් කළ දිනයේ සිට මාස 12 ක කාලයක් තුළ බේරා ගැනීමට හැකිවිය යුතුය. මේ අනුව මෙම ආඥා පනත යටතේ උකසක් ඇති කරගත හැකි එකම කාලසීමාව මාස 12 ක කාලයක් වේ. උකස්කරුවන්ගේ ආඥා පනත යටතේ ලබා දෙන ණයක් සඳහා අයකල හැකි උපරිම මාසික පොළිය 2% කි. එනම්, උපරිම වාර්ෂික පොළිය 24% කි. අදාළ කාලය තුළ බේරා නොගත් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම අනිවාර්ය වේ. උකස් හිමියා වෙන්දේසියේ විකිණීමෙන් ලබා ගන්නා මුදල තමන්ට අය විය යුතු ණය මුදල හා පොලිය ඉක්මවන්නේ නම් ඒ බව උකස්කරුට දැනුම් දී එම වැඩිපුර මුදල ලබා ගැනීමට ඉදිරිපත් වුවහොත්, උකස්කරු වෙත එම මුදල ලබාදීමට කටයුතු කළ යුතුය.

උකස් ගන්නන්ගේ ආඥා පනතට අමතරව උකස් පනත යටතේ ද චංචල දේපළ උකස් කළ හැක. උකස් පනත යටතේ චංචල දේපළ උකස් කිරීමේ දී උකස් හිමියාගේ සන්තකයට දේපළ පවරා දීම අත්‍යවශ්‍ය නොවේ. තවද, උකස් පනත යටතේ කොටස් හිමිකම් හා ජීවිත රක්ෂණ වැනි අස්පර්ශනීය චංචල දේපළ උකස් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන ද පනවා ඇත.

වර්තමානයේ ඇතැම් මුදල් සමාගම් චංචල දේපළ සම්බන්ධ උකස් ගනුදෙනු උකස් ගන්නන්ගේ ආඥා පනත අනුව සිදු නොකොට උකස් පනත යටතේ සිදු කරනු ලබයි. උකස් ගන්නන්ගේ ආඥා පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අත්‍යවශ්‍ය වීම, උකස් කාලය මාස 12 කට සීමා වීම හා මාසික

පොලී අනුපාතය 2% ක උපරිමයකට යටත් වීම වැනි ප්‍රතිපාදන උකස් පනත යටතේ මගහැරීමට හැකිවීම මෙයට ප්‍රධාන හේතුව වේ.

1988 අංක 30 දරන බැංකු පනතින් බලපත්‍රලාභී වාණිජ බැංකු උකස් ගන්නන්ගේ ආඥා පනතින් නිදහස් කර ඇති අතර ඒ වෙනුවට බැංකුවල උකස් ව්‍යාපාර නියාමනය කිරීම සඳහා කොන්දේසි පැනවීමට මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත බලය ලබා දී ඇත. මේ අනුව ඉහත සඳහන් කළ "බලපත්‍රලාභී වාණිජ බැංකු (උකස්) කොන්දේසි" මුදල් මණ්ඩලය විසින් පනවා ඇත. ඊට අමතරව වාණිජ බැංකුවලට උකස් පනත යටතේ ද උකස් ගනුදෙනුවලට එළඹිය හැක.

ඕනෑම පුද්ගලයෙකුට උකස් පනත යටතේ චංචල දේපළක් උකසට ගත හැක. එහෙත් එම උකස බලාත්මක කිරීමට නම් ඔහු අනිවාර්යයෙන් අධිකරණය ඉදිරියට ගොස් අධිකරණ තීන්දුවක් ලබා ගත යුතුය. සුළු වටිනාකමක් ඇති චංචල දේපළක් හා සම්බන්ධ උකසක් බලාත්මක කිරීමට අධිකරණය ඉදිරියට යෑමට සිදු වුවහොත් එය කාලය හා මුදල් අපතේ යවන ක්‍රියාදාමයක් වනු ඇත. උකස් පනතින් "අනුමත ණය දෙන ආයතන" (Approved Credit Agencies) මෙම අපහසුතාවයෙන් මුදවා ඇත.

උකස් පනත යටතේ අනුමත ණය දෙන ආයතන යනු,

(අ) බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු

(ආ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

(ඇ) වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ගැසට් පත්‍රයෙහි පළ කරන වෙනත් ඕනෑම ආයතනයක් වේ.

එම අනුමත ණය දෙන ආයතනවලට උකස් පනත යටතේ උකසට හෝ චංචල දේපළ ණයකරු විසින් ණය ආපසු ගෙවීම පැහැර හැරි විටක දී නඩු විභාගයකින් තොරව විකුණා දැමීමට බලය හිමි වේ. මෙම විකිණීම ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විය යුතු අතර, එලෙස විකුණා ලැබෙන මුදල එම ආයතනයට අයවිය යුතු මුදලට වඩා වැඩිනම් වැඩිපුර මුදල උකස්කරුට ගෙවිය යුතුය. දැනට අනුමත ණය දෙන ආයතන ලෙස ආයතන 350 ක් පමණ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කර ඇත.

මෙයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 9 වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුව යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු හැරුණු විට වෙන උකස් ගන්නා ආයතන (Pawn Brokers) සඳහා ප්‍රඥප්ති පැනවීමේ බලය පළාත් සභාවලට ලබා දී ඇත. දැනට බස්නාහිර පළාත් සභාව විසින් 2001 අංක 03 දරන උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පනවා ඇත. මේ අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු හැරුණු විට බස්නාහිර පළාතේ උකස් ගන්නන්ට බලපාන්නේ මෙම ප්‍රඥප්තියයි.

ලංකාවේ උකස් ගනුදෙනු සඳහා නීති ගණනාවක් අදාළ වන බව පෙනීයයි. මෙලෙස නීති ගණනාවක් අදාළ වීමත් එම නීති ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන ගණනාවක් මැදිහත් වීමත් සංකීර්ණ තත්ත්වයක් නිර්මාණය කර ඇත. මෙම නීති හා ක්‍රියාවලි සරල කර මහජනතාවට වටහා ගත හැකි පහසු නීතිරීති සකස් කිරීම සඳහා මැදිහත් වීම අදාළ රාජ්‍ය ආයතනයවලත්, ව්‍යවස්ථාදායකයේත් වගකීමයි.✪

# හරිත දළ දේශීය නිෂ්පාදිතය හඳුන්වා දීම

**උදේනි ලංසකාර**

සහකාර අධ්‍යක්ෂිකා, ප්‍රතිපත්ති සමාලෝචන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**(1) අරමුණ**

ආර්ථික උපාය මාර්ග හා ක්‍රමවේදවලට හරිත ප්‍රවේශයක් ලබාදීම පිළිබඳ සංකල්පය අද ලෝකයේ කතා බහට ලක්වී ඇති ප්‍රබල කරුණක් බවට පත්ව ඇත. එම නිසා හරිත ආර්ථිකය නම් වූ සංකල්පය සහ එය දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මැනීමේ මිනුමක් ලෙස යොදා ගැනීමේ තාර්කිකත්වය පිළිබඳ විමසා බැලීම මෙම ලිපියේ අරමුණ වේ.

**(2) හරිත ආර්ථිකය යනු කුමක්ද?**

ලෝක ප්‍රජාව පරිසර හිතකාමී වැඩපිළිවෙලකට ගෙන යෑමේ අරමුණින් 1992 වසරේ දී ඇරඹි රියෝ සමුළුවේ 20 වැනි සාංවත්සරිකය 2012 වසරේ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ (The United Nations Conference on Sustainable Development) සමුළුව RIO + 20 නමින් බ්‍රසීලයේ රියෝද ජැනරෝ හි දී පැවැත් විය. එහි තේමාව වූයේ "හරිත ආර්ථිකට අප ඇතුළත් ද?" යන්නයි. හරිත ආර්ථිකයක් උදෙසා ලෝක ජනතාව තම දායකත්වය කෙසේ ලබා දිය යුතු ද යන්න අවධාරණය කිරීම, සමුළුවේ අරමුණ විය.

"හරිත ආර්ථිකය" පිළිබඳ සංකල්පය 1989 දී පමණ බිහිවූවක් වන අතර, ඒ සඳහා විවිධ නිර්වචන පවතී. ඒවායින් කිහිපයක් මෙසේය.

(අ) එක්සත් ජාතීන් ගේ පාරිසරික වැඩසටහන (United Nations Environment Programme-UNEP)[1] අනුව "හරිත ආර්ථිකය" යනු,

"පාරිසරික අවදානම හා පාරිසරික හිඟකම අඩු කර ගනිමින් ලෝක ප්‍රජාව ගේ ශුභසාධනය හා සමාජ සාධාරණත්වය ඉහළ නැංවීමයි". එය සරල ම ආකාරයෙන් ප්‍රකාශ කළහොත්, අඩු කාබන් විමෝචනය (Low Carbon Emission), සම්පත්වල උපරිම කාර්යක්ෂමතාව (Resource Efficiency) සහ සමාජයීය අන්තර්ගතභාවය (Socially Inclusive) ඇති කිරීමයි.

කාබන් විමෝචනය හා පරිසර දූෂණය අවම කරමින් බලශක්තිය හා සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් පරිසර පද්ධතියට සහ ජෛව විවිධත්වයට සිදුවිය හැකි හානිය වළක්වාලමින්, රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන මඟින් ආදායම හා සේවා නියුක්තිය ඉහළ නංවාලීම ඉන් අදහස් වේ.

(ආ) ආර්ථික සහයෝගීතා සහ සංවර්ධන සංවිධානය (Organization for Economic Co-operation and Development - OECD)[2] අනුව "හරිත ආර්ථිකය" යනු,

ස්වාභාවික වත්කම්වල ගුණාත්මක හා ප්‍රමාණාත්මකතාව මත ඇති වන අහිතකර බලපෑම අවම කරගනිමින් ඇති කරගන්නා වූ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය යි.

මෙම නිර්වචන දෙකෙහි වෙනස සලකා බැලීමේ දී, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විශේෂයෙන් දිළිඳුකම පිටුදැකීම සහ සමාජ සාධාරණත්වය වැනි සමාජ මිනුම් කෙරෙහි අවධානය යොමු කර ඇති බව පෙනේ.

1. Towards a green economy-UNEP

2. Green Growth Strategy-OECD

(ඇ) හරිත චින්තකයෙකු වූ කාර්ල් බුකාර්ට් (Karl Burkart) [3] හරිත ආර්ථිකය නිර්වචනය කිරීමේ දී එය ප්‍රධාන කරුණු 6 ක් මත ගොඩනැගී ඇති බව දක්වයි. එනම්, පුනර්ජනනීය බලශක්තිය (Renewable Energy), හරිත ඉදිකිරීම් හා නිර්මිත (Green Construction and Created), පිවිතුරු පරිවහනය (Clean Transportation), ජල කළමනාකරණය හා සංරක්ෂණය (Water Management and Conservation), කසල සංරක්ෂණය (Garbage Conservation) සහ භූමි සංරක්ෂණය (Land Conservation).

(ඈ) ග්ලෝබල් සිටිසන්ස් සෙන්ටර්[4] හි (The Global Citizens Center) නිර්වචනයට අනුව හරිත ආර්ථිකයක් ක්‍රියාත්මක වීම ත්‍රිත්ව පදනමක් මත සිදු වේ. එ නම්, තිරසාර ආර්ථික සංවර්ධනය (Sustainable Economic Development), සමාජ සාධාරණත්වය (Social Equity) සහ දේශීය මූලාශ්‍ර (Native Sources).

හරිත දළ දේශීය නිශ්පාදිතය පිළිබඳ ව සලකා බැලීමේ දී "හරිත වර්ධනය" (Green Growth) පිළිබඳ සංකල්පය ද සලකා බැලේ. හරිත වර්ධනය යන්න තුළින් ගම්‍ය වනුයේ, තිරසාර අයුරින් ස්වාභාවික සම්පත් යොදාගනිමින් ආර්ථික වර්ධනය ලබාගත යුතු ආකාරයයි. මෙය අප දැනට භාවිතා කරනු ලබන "ආර්ථික වර්ධනය" යන සංකල්පය සඳහා විකල්ප අදහසකි.

3. http:www.mnn.com/green-tech/research-innovations/blogs/how-do-you-define-the-green-ecomomy


4. http:www.green-economy-blog.blogspot.com/2010/12/what-is-green-economy.html

**(3) සාම්ප්‍රදායික දළ දේශීය නිෂ්පාදිතය වලංගු මිනුමක්ද?**

රටක දළ දේශීය නිෂ්පාදිතය වශයෙන් සලකනු ලබන්නේ, යම් රටක යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ නිෂ්පාදනය කරන ලද සියලුම අවසන් භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමයි. මෙය ගණනය කිරීම සඳහා නිෂ්පාදන ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය හා වියදම් ප්‍රවේශය යොදා ගනු ලබයි. නමුදු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ දී පරිසරයට සිදුවන හානිදායක තත්ත්ව සහ අලාභ පිළිබඳව සලකා නො බැලීම නිසා ද.දේ.නි. පිළිබඳ නිවැරදි චිත්‍රයක් මෙයින් පිළිඹිබු නො වන බව පාරිසරික විද්‍යාඥයින්ගේ අදහසයි. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින්, සාම්ප්‍රදායික ද.දේ.නි. මැනීමේ ක්‍රමවේදයේ පැවති ඌනතාවලට ප්‍රතිචාරයක් ලෙස 1990 දශකයේ මුල් කාලයේ "හරිත ආර්ථිකය" පිළිබඳ සංකල්පය බිහි විය. එහිදී ස්වාභාවික සම්පත් ක්ෂයවීමේ ආර්ථික පිරිවැයත් පාරිසරික දූෂණය හේතුවෙන් මානව ශුභසිද්ධිය කෙරෙහි වන අහිතකර බලපෑමේ ආර්ථික පිරිවැයත් පිළිබඳව අවධානය යොමු කරන ලදි.

සාම්ප්‍රදායික ද.දේ.නි. හා හරිත ද.දේ.නි. (Green GDP) සංසන්දනය කිරීමේ දී හරිත ද.දේ.නි. රටක ද.දේ.නි. මැනීමේ දී වඩා හොඳ මිනුමක් බව පාරිසරික විද්‍යාඥයින්ගේ අදහසයි. මන්ද, හරිත ද.දේ.නි. මැනීමේ දී පහත මූලිකාංග ඇතුළත් වීමත්

**අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය (තෝරා ගත් රටවල)**




(Source: The International Human Dimensions Programme on Global Environmental Change (UNU-IHPD),UNEP)

සාම්ප්‍රදායික ද.දේ.නි. ගණනය කිරීමේ දී මේ සඳහා ගැලපීමක් නොකිරීමත් ය.

1. පාරිසරික වියදම (Environmental Expenditure): පාරිසරික හානිය සහ පරිසර දූෂණය වළක්වා ගැනීමට යන පාරිසරික වියදම.

2. වෙළෙඳපොළේ අලෙවි නොවන සේවා (Non Marketed Goods): ස්වාභාවික පරිසරය විසින් මිනිසාගේ පරිභෝජනය උදෙසා යොදාගන්නා ගොඩනැගිලි අමුද්‍රව්‍ය, දර, ඖෂධ ශාඛ වර්ග.

3. වෙළෙඳපොළේ අලෙවි නොවන සේවා (Non Marketed Services): ස්වාභාවික පරිසරය මඟින් සපයනු ලබන අලෙවි නොවන සේවා වන, වනාන්තර මඟින් ස්වාභාවික පරිසරය ආරක්ෂා කරදීම සහ දියබෙත්ම ආරක්ෂා කර දීම වැනි සේවා.

4. ස්වාභාවික ප්‍රාග්ධන පරිභෝජනය (Consumption of Natural Capital): ස්වාභාවික සම්පත් ක්ෂයවීම.

මෙ ලෙස සාම්ප්‍රදායික ද.දේ.නි. තුළින් ආර්ථික සුභසාධනය පිළිබඳ නිසියාකාර මැනීමක් සිදු නො වන හෙයින් ඒ සඳහා විකල්ප ක්‍රමවේද ගණනාවක් ඉදිරිපත් වී ඇත.

### 3.1 අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය (Inclusive Wealth Index (IWI)2012)

අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය[5] මඟින් ජාතීන්ගේ ධනය (Wealth of Nations) පිළිබඳ ව මැනෙන අතර ඒ සඳහා කර්මාන්ත ගිණුම්, මානව සහ ස්වාභාවික ප්‍රාග්ධන ගිණුම් (වනාන්තර, මත්ස්‍ය, පොසිල ආදී) යොදාගනු ලබයි.

මෙය සෑදීමේ දී ඉහළ, මධ්‍යම සහ පහළ ආදායම් ඇති ආර්ථික 20 ක් සියළුම මහාද්වීප නියෝජනය වන පරිදි යොදා ගෙන ඇති අතර ඒවා ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙන් 72% ක් සහ ලෝක ජනගහනයෙන් 56% ක් නියෝජනය කරයි. එම රටවල් තෝරාගැනීමේ දී භූගෝලීය, සමාජයීය, ආර්ථිකමය විවිධත්ව සහ ආර්ථික විද්‍යාත්මක ස්වභාව සැලකිල්ලට ගන්නා ලදි. එ සේ ම කාලපරිච්ඡේදය ලෙස අවුරුදු 19 ක කාලයක් එනම් (1999 - 2008) දක්වා කාලය යොදා ගන්නා ලදි. මෙම වාර්තාව වසර දෙකකට වරක් ප්‍රකාශයට පත්වන අතර එය ප්‍රථම වරට ප්‍රකාශයට පත්කරන ලද්දේ 2012 වසරේ දී ය.

මෙයින් පහත දෑ නිගමනය කළ හැකිය.

- මෙම දර්ශකයට අනුව ඉහළ ම ස්ථානයේ සිටින්නේ චීනය වන අතර පහළ ම ස්ථානයේ සිටින්නේ නයිජීරියාවයි. චීනයේ මානව ප්‍රාග්ධනය සහ කාර්මික ප්‍රාග්ධනය ද ඉහළ මට්ටමක පවතී. නමුත් ස්වාභාවික ප්‍රාග්ධනය සෘණ මට්ටමේ පවතී. නයිජීරියාව පිළිබඳ ව සලකා බැලීමේ දී, එහි ස්වාභාවික ප්‍රාග්ධනය ඉහළ සෘණ අගයක් ගන්නා අතර මානව ප්‍රාග්ධනය ද සෘණ අගයක් ගනී. මෙහිදී කාර්මික ප්‍රාග්ධනය පමණක් සුළු වශයෙන් ධන අගයක් ගෙන ඇත.

- එසේම අඩුම සෘණ ස්වාභාවික ප්‍රාග්ධනයක් සහිත රට වනුයේ බ්‍රිතාන්‍යය වේ.

- මෙම රටවල් 20 න් අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය ධන අගයක් සහිත රටවල් ගණන 14 ක් වේ. අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය සෘණ අගයක් සහිත රටවල් ගණන 6 ක් වන අතර, ස්වාභාවික ප්‍රාග්ධනය අධික ලෙස ක්ෂයවීම, මෙම රටවල දර්ශකය සෘණවීමට බලපා ඇති ප්‍රධාන හේතුවයි.

### 3.2 බෝස්ටන් විශ්වවිද්‍යාලය ඉදිරිපත් කළ විකල්ප ක්‍රම

මෙම විශ්වවිද්‍යාලය මඟින් ද රටක ද.දේ.නි. මැනීම සඳහා විකල්ප ක්‍රමවේද ගණනාවක් පෙන්වා දී ඇත. එනම්,

(අ) ද.දේ.නි. සඳහා විධිමත් දර්ශක සම්පාදනය කිරීම: ආදායමේ තිරසාරත්වය සහ හරිත ද.දේ.නි. මැනීම සඳහා සාමාන්‍ය ප්‍රගති දර්ශකය (General Progress Indicator) සම්පාදනය කොට ඇත.

(ආ) සාම්ප්‍රදායික ද.දේ.නි. සඳහා සංයුක්ත දර්ශක ඇතුළත් කිරීම: උදාහරණ:- මානව සංවර්ධන දර්ශකය (Human Development Index)

ඇ) ද.දේ.නි. සඳහා දර්ශක සමූහය යොදා ගැනීම: උදාහරණ:- සහස්‍ර සංවර්ධන දර්ශක. (Millennium DevelopmentIndices)

සාම්ප්‍රදායික ද.දේ.නි. තුළින් ද.දේ.නි. පිළිබඳ නිවැරදි චිත්‍රයක් පිළිබිඹු නො වන නිසා මේ සඳහා මෙ වැනි විකල්ප ක්‍රමවේද ඉදිරිපත් කර ඇත. අද වන විට ලොව බොහෝ රටවල් විකල්ප ක්‍රමවේදයක් වන පාරිසරික ගිණුම්කරණය වෙත යොමු වී ඇත. එබැවින් ඒ පිළිබඳ ව සොයාබැලීම වැදගත් වේ.

---

5.සාම්ප්‍රදායික දළ දේශීය නිෂ්පාදිතය තුළින් රටක යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ දී නිපදවන ලද සියළුම භාණ්ඩ හා සේවාවල වටිනාකම පමණක් මැනෙන අතර එ තුළින් වාතය, ජලය, සෞඛ්‍යය වැනි සාධකවල ගුණාත්මක තත්ත්වය සහ සතුට පිළිබඳ ව මැනීමක් සිදු නොවේ. එම නිසා, එක්සත් ජාතීන් ගේ පාරිසරික සංවිධානයත් (UNEP) ගෝලීය පාරිසරික වෙනස්වීම් පිළිබඳ ජාත්‍යන්තර මානව මිනුම් වැඩසටහනත් (The International Human Dimensions Programme) මූලිකත්වය ගෙන ප්‍රමාණාත්මක සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජල දශක වැඩසටහන (UN-Water Decade Programme) සහ RIO+20 සමුළුවේ ස්වාභාවික ප්‍රාග්ධන ව්‍යාපෘතියේ (Natural Capital Project) සහයෝගීත්වයෙන් අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය හඳුන්වා දෙන ලදි.

### 4. පාරිසරික ගිණුම්කරණය මේ සඳහා යොදාගන්නේ කෙසේද?

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන සහ ලෝක බැංකුව එක්ව ස්වාභාවික සම්පත් සහ පරිසරයේ භෞතිකමය සහ මූල්‍යමය ශක්‍යතාව පරීක්ෂා කිරීමටත් පරිසරය සහ ආර්ථිකය අතර පවත්නා අන්තර් සබඳතාව මැනීම සඳහාත් පාරිසරික ව ගැලපූ දර්ශක (Environmentally Adjusted Indicators) වැඩිදියුණු කිරීම සඳහාත් පාරිසරික ගිණුම්කරණය (Environmental Accounting) යොදා ගන්නා ලදි. ඊට සමගාමී ව එක්සත් ජාතීන් ගේ සංඛ්‍යාන අංශය (United Nations Statistics Division) මගින් ද පාරිසරික ගිණුම්කරණය සඳහා වූ ක්‍රමවේද වැඩිදියුණු කරන ලදි.

#### 4.1 පාරිසරික ගිණුම්කරණයේ ප්‍රභේද මොනවා ද?

1. පාරිසරික කළමනාකරණ ගිණුම්කරණය (Environmental Management Accounting)

මෙහිදී ද්‍රව්‍යමය සහ බලශක්ති තුලන ආකාර පිළිබඳවත් පාරිසරික පිරිවැය පිළිබඳවත් සලකා බැලේ.

2. පාරිසරික මූල්‍යමය ගිණුම්කරණය (Environmental Financial Accounting)

මෙහි දී පාරිසරික වගකීම් පිරිවැයත් වෙනත් සැලකිය යුතු පාරිසරික පිරිවැයත් පිළිබඳව සලකා බැලේ.

3. පාරිසරික ජාතික ගිණුම්කරණය (Environmental National Accounting)

මෙහි දී ස්වාභාවික සම්පත් තොග සහ ප්‍රවාහ පිළිබඳවත් පාරිසරික පිරිවැය සහ බාහිරතා පිරිවැය පිළිබඳවත් සලකා බැලේ.

පාරිසරික ගිණුම්කරණයේ ඉතිහාසය පිළිබඳව සලකා බැලීමේ දී, 1970 දශකයේ ඇතිවූ බලශක්ති අර්බුදය හේතුකොට ගෙන මෙම සංකල්පය පිළිබඳ උනන්දුවක් ඇති වූ අතර, 1992 වසරේ පැවති RIO සමුළුවේ දී පාරිසරික ගිණුම්කරණයේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදි.

#### 4.2 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්නේ කෙසේද?

හරිත ජාතික ගිණුම්කරණයේ දී ආර්ථික ක්‍රියාකාරකම් හේතුකොට ගෙන ස්වාභාවික සම්පත් අහිමිවීමත් පරිසරයට සිදුවන හානියත් ගණනය කරනු ලබයි. මෙසේ සිදුවන හානිය අඩු කොට ගණනය කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අගයන් රටක ආර්ථික ක්‍රියාකාරිත්වය පෙන්වන වැදගත් දර්ශකයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංඛ්‍යාන අංශය පරිසර සාධක එකතුකොට ගත් නව ක්‍රමයක් ලෙස සම්මත ආදායම් ගිණුම් හා ශේෂ පත්‍ර මෙම නව ක්‍රමයට එකතු කිරීමට කටයුතු කර ඇත. මෙහි දී මූලිකව සෑම රටක් සඳහා ම ඒ රටේ ප්‍රමාණාත්මක ව මිනුම් කරන ලද සියළු ම ස්වාභාවික සම්පත් ඇතුළත් ව විස්තරාත්මක ලේඛනයක් සකසනු ලබයි. සියලු ම රටවල් සඳහා මෙ වැනි විස්තරාත්මක ලේඛනයක් සෑදීමට නොහැකි වුවත් සමහර රටවල් එහි ඇති ස්වාභාවික සම්පත් තොගය වෙනුවෙන් කිසියම් මුදල් වටිනාකමක් ආරෝපණය කරනු ලබයි. මේ තුළින් පරිසරයට අහිතකර නිෂ්පාදන හා පරිභෝජන රටා හඳුනා ගත හැකි වේ. හරිත ගිණුම්කරණය, පාරිසරික ගිණුම්කරණ ක්‍රමවේදයක් වන අතර ඒ සඳහා භාවිත කරනු ලබන ක්‍රම 2 ක් පහතින් දක්වා ඇත.

(අ) පළමු ක්‍රමය: මේ යටතේ පහත ප්‍රවේශය හරිත ද.දේ.නි. ගණනය කිරීම සඳහා යොදා ගනු ලබයි.

හරිත දළ දේශීය නිෂ්පාදිතය[6] = සාම්ප්‍රදායික දළ දේශීය නිෂ්පාදිතය - ස්වාභාවික සම්පත් ක්ෂයවීම හා පාරිසරික පරිහානිය.

(ආ) දෙවන ක්‍රමය: මේ යටතේ පහත ප්‍රවේශය හරිත ද.දේ.නි. ගණනය කිරීම සඳහා යොදා ගනු ලබයි.

- හරිත දළ දේශීය නිෂ්පාදිතය (GGDP) = සාම්ප්‍රදායික දළ දේශීය නිෂ්පාදිතය (TGDP ) - පාරිසරික පිරිවැය (EC)

පාරිසරික පිරිවැය (CE) = (පාරිසරික හානිය වළක්වා ගැනීමට යන වියදම (PC), පාරිසරික සම්පත් හානිය (DC), ස්වාභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වියදම (RC), පාරිසරික සම්පත් පවත්වාගෙන යෑම සඳහා කරනු ලබන වියදම් (MC)

ඒ අනුව,

GGDP = TGDP-(PC+DC+RC+MC ) වේ.

මෙම ක්‍රමවේද දෙකෙහි වෙනස සලකා බැලීමේ දී, පළවෙනි ක්‍රමය මඟින් පාරිසරික හානිය වළක්වා ගැනීමට, ස්වාභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ පාරිසරික සම්පත් පවත්වාගෙන යෑමට කරනු ලබන වියදම් පිළිබඳ ව නොසලකා හැර ඇති අතර, දෙවැනි ක්‍රමය මඟින් මෙම වියදම් සියල්ල පිළිබඳව සලකා බැලීමක් සිදු කොට ඇත.

#### 4.3 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා පාරිසරික - ආර්ථික ගිණුම් ක්‍රමවේදය (System of Environmental and Economic Accounting - SEEA) යොදාගන්නේ කෙසේද?

SEEA එක්සත් ජාතීන් ගේ සංඛ්‍යාන අංශය මඟින් ජාත්‍යන්තර සංඛ්‍යානමය ප්‍රමිතීන්ට අනුව 1993 දී පළමුවරට ප්‍රකාශයට පත්වූ අතර එය මේ වනවිට බොහෝ රටවල් පාරිසරික ගිණුම්කරණ සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරනු ලබයි. මෙ මඟින් පරිසරය හා ආර්ථිකය අතර පවතින අන්තර් සබඳතාවය පෙන්වන අතර ජාතික ගිණුම් පද්ධතිය (System of National Account - SNA) සඳහා ඌනපූරකයක් ද වේ. එ සේ ම, මේ සඳහා

6. China Green National Accounting Study Report - 2004

**SEEA රාමුව**

| | | |
|---|---|---|
| ආරම්භක තොගය | ආර්ථික සම්පත් | පාරිසරික සම්පත් |

+

| | දේශීය නිෂ්පාදිත (කර්මාන්ත) | අවසාන පරිභෝජනය (කුටුම්භ, රජය) | ප්‍රාග්ධන සම්පාදනය | ප්‍රාග්ධන සමුච්චිතය | බාහිර ලෝකය |
|---|---|---|---|---|---|
| නිෂ්පාදන සැපයුම් (භාණ්ඩ හා සේවා) | නිමැවුම් (Oi) | | | | ආනයන M |
| නිෂ්පාදන භාවිත (භාණ්ඩ හා සේවා) | අතරමැදි පරිභෝජනය (ICi) | අවසාන පරිභෝජනය (C) | දළ ප්‍රාග්ධන සම්පාදනය (CF) | | අපනයන X |
| ස්ථාවර ප්‍රාග්ධන භාවිතය (ප්‍රාග්ධන පරිභෝජන) | ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (CCi) | | ප්‍රාග්ධන පරිභෝජනය (CC) | | |
| එකතු කළ වටිනාකම VA/NDP | NVAi=Oi - ICi - CCi<br>NDP = ∑NVAi | | | | |
| නිෂ්පාදිත නොවන වත්කම් හි භාවිතය (පිරිහීම හා ක්ෂය වීම) | කර්මාන්තවල පාරිසරික පිරිවැය (ECi) | කුටුම්භවල පාරිසරික පිරිවැය (ECh) | ස්වාභාවික ප්‍රාග්ධන (EC) පරිභෝජනය | | |
| ගලපන ලද පාරිසරික දර්ශක | EVAi = NVAi ECi<br>EDP = ∑EVAi ECh | | ECF = (CF-CC) - EC | | |

+

| |
|---|
| වෙනස්වීම්, ඇගයීම්, ගැලපීම්, පිළි ඇගයුම් |

=

| | | |
|---|---|---|
| අවසාන තොගය | ආර්ථික සම්පත් | පාරිසරික සම්පත් |

GDP - ද.දේ.නි.

NDP - ශු.ජා.නි.

EDP - හරිත ද.දේ.නි.

NVAi - කර්මාන්තවල දළ එකතු කළ වටිනාකම

EVAi - කර්මාන්තවල පාරිසරිකව ගලපන ලද එකතු කළ වටිනාකම

EDP - පාරිසරකව ගලපන ලද ද.දේ.නි.

ECF - පාරිසරිකව ගලපන ලද ප්‍රාග්ධන නිර්මාණය

**මූලාශ්‍රය : Integrated Environment and Economic Accounting - An Operational Manual - 2000, UNSD**

වූ ජාත්‍යන්තර අත්පොත ද (International Manual) 2011 වන විට සංශෝධනය කර ඇත. පහත රූපසටහනින් හරිත ද.දේ.නි. ගණනය කිරීම සඳහා SEEA සංකල්පිත රාමුව යොදාගන්නා ආකාරය දක්වා ඇත.

### 4.4 SEEA හි සංකල්පිත රාමුව

ඉහතින් දක්වන ලද SEEA කේන්ද්‍රීය රාමුව පහත පරිදි සැකෙවින් දැක්විය හැකිය.

(1) නිෂ්පාදන සැපයුම් සහ නිෂ්පාදන භාවිත සර්ව සාම්‍යය (identity)

O + M = IC + C + CF + X

(2) දේශීය කර්මාන්තවල සමුච්චිත (පාරිසරිකව ගලපන ලද) එකතු කළ වටිනාකම් හි (EVAi) සර්ව සාම්‍යය.

EVAi = Oi - ICi - CCi - ECi = NVAi - ECi

(3) සමස්ත ආර්ථිකය සඳහා (පාරිසරිකව ගලපන ලද) දළ දේශීය නිෂ්පාදන සර්ව සාම්‍යය

EDP = ∑EVAi - ECh = NDP - EC = C+CF - CC - EC + X- M

මෙම පාරිසරික ආර්ථික ගිණුම් (SEEA) කේන්ද්‍රීය රාමුව තුළ දක්වා ඇති පාරිසරික සම්පත් තනි තනි පාරිසරික සංරචක 7 ක් මඟින් දක්වා ඇත. එනම්, ඛනිජ සහ බලශක්ති සම්පත්, භූමිය, පාංශු සම්පත, දැව සම්පත, ජලජ සම්පත (වගා කරන ලද ජලජ සම්පත, ස්වාභාවික ජලජ සම්පත), වෙනත් ජෛව විද්‍යාත්මක සම්පත (දැව සම්පත හා ජලජ සම්පත හැර), ජල සම්පත (මතුපිට ජලය, භූ ජලය, පාංශු ජලය) වේ.

SEEA කේන්ද්‍රීය රාමුව තුළ මූල්‍යමය සැපයුම් සහ භාවිත වගු මෙන් ම භෞතිකමය සැපයුම් සහ භාවිත වගු පිළිබඳ ව ද විස්තර කර ඇති අතර එය පාරිසරික ගිණුම්කරණය සඳහා මාර්ගෝපදේශයක් සපයයි.

### 4.5 SEEA ප්‍රායෝගිකව භාවිත කරන රටවල් මොනවාද?

හරිත ද.දේ.නි. පිළිබඳ සංකල්පය වර්තමානයේ ලොව පුරා වඩාත් ප්‍රචලිත වෙමින් පවතී. මේ වනවිට ලෝකයේ රටවල් 25 ක පමණ මෙම ක්‍රමය පරීක්ෂණාත්මක මට්ටමින් භාවිත කරන අතර එම රටවල් අතරට චීනය, නෝර්වේ, ඉන්දුනීසියාව, නැමිබියාව, නෙදර්ලන්තය, චිලී රාජ්‍යය, කොස්ටරිකාව, පිලිපීනය, ඉන්දියාව, ජපානය, එක්සත් රාජධානිය ඇතුළත් වේ.

චීනය මේ වන විට පාරිසරික ආර්ථික ගිණුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන රටක් ලෙස හඳුන්වා දිය හැකි ය. චීනයේ ජාතික සංඛ්‍යාන කාර්යාංශය (National Bureau of Statistics) මඟින් ආර්ථිකය සහ පරිසරය අතර පවතින අන්තර් සබඳතාව මැනීම සඳහා SEEA සංඛ්‍යානමය රාමුවක් ලෙස යොදා ගනු ලබයි.

චීනය ප්‍රථම වරට 2004 වසරේ දී හරිත ද.දේ.නි. ගණනය කළ අතර 2006 දී එය ප්‍රකාශයට පත් කරන ලදි. එයට අනුව පරිසර හානියේ මූල්‍ය පිරිවැය යුආන් මිලියන 511.87[7] (එක්සත් ජනපද ඩොලර් මිලියන 82.01) වූ අතර 2009[8] දී එය යුආන් ට්‍රිලියන 1.4 (එක්සත් ජනපද ඩොලර් මිලියන 0.22) විය. එය පෙර වසර හා සැසඳීමේ දී 9.2% ක වැඩි වීමකි. මෙම වාර්තාවට අනුව චීනය පාරිසරික පවිත්‍රතාව වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.8 ක් වැය කොට ඇත. පිලිපීනය මෙය 1998 දී නියාමන ව්‍යාපෘතියක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (United Nations Development Programme - UNDP) මූල්‍ය ආධාර සහ එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාන අංශයේ තාක්ෂණික සහයෝගයෙන් යුතු ව මෙය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිණුම් සම්පාදනය සඳහා වනාන්තර (Forests), මත්ස්‍ය සම්පත (Fish), ජලය (Water), ඛනිජ සහ බලශක්ති (Mineral and Energy), භූමිය සහ පස (Land and Soil) යොදාගනු ලබයි.

SEEA ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කරන තවත් රටවල් කාණ්ඩයක් වන්නේ යුරෝපා සංගමයට අයත් රටවල් ය. මෙම රටවල් වායු විමෝචනය (Air Emissions), ද්‍රව්‍යමය ප්‍රවාහ (Material Flows), පාරිසරික ආරක්ෂණ වියදම් (Environmental Protection Expenditure), පාරිසරික භාණ්ඩ හා සේවා අංශය (Environmental Goods and Services Sector), වනාන්තර ගිණුම (Forest Account) ආදිය SEEA සම්පාදනයේ මූලිකාංග ලෙස යොදාගනී. එ සේ ම 2011 ජූලි මාසයේ යුරෝපා පාර්ලිමේන්තු සහ නීති උපදේශනය මඟින් මූලික අදියරයේ දී ඒකක තුනක් මත පාරිසරික ගිණුම් සම්පාදනය කළ යුතු බවට නීතියක් පනවන ලදී. එම ඒකක නම් පාරිසරික බදු, කර්මාන්ත සහ කුටුම්භ මඟින් වායුවට විමෝචනය කරනු ලබන ද්‍රව්‍ය දහ හතරක සහ ආර්ථිකය පුරා පැතිරුණ ද්‍රව්‍යමය ප්‍රවාහවල ගිණුම් වේ.

### 4.6 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා ආර්ථික සහයෝගීතා සහ සංවර්ධන සංවිධානය යොදාගන්නා ක්‍රමවේදය කුමක්ද?

ආර්ථික සහයෝගීතා සහ සංවර්ධන සංවිධානය යොදා ගන්නා හරිත ගිණුම්කරණ සංකල්පිත රාමුව පහතින් දක්වා ඇත.

ආර්ථික සහයෝගීතා සහ සංවර්ධන සංවිධානය හරිත වර්ධන මිනුම් රාමුවට අනුව, දර්ශක පහත පරිදි කාණ්ඩ හතරකට බෙදා ඇත.

1) නිෂ්පාදන හා පාරිභෝජනවල කාර්යක්ෂමතාව (Efficiency of Production and Consumption)


2) ස්වාභාවික සම්පත් පදනම (The Natural Asset Base)

3) ජීවිතවල පාරිසරික ගුණාත්මකතාව (The Environmental Quality of Life)

7. China Green National Accounting Study Report - 2004

8. China Green National Accounting Study Report - 2009

**හරිත වර්ධන දර්ශක වල සංකල්පීය ක්‍රමවේදය**




**මූලාශ්‍රය : (OECD 2010)**

4) ප්‍රතිපත්ති ප්‍රතිචාර සහ ආර්ථිකමය අවස්ථා (Policy Responses and Economic Opportunities)

ඉහත රූපසටහන මඟින් මෙම දර්ශකවල අන්තර් සබඳතාව විස්තර කරනු ලබයි. ඒ අනුව පරිසරයට වන බලපෑම ඉහත දක්වා ඇති දර්ශක හතර මත තීරණය වේ. එය මෙසේ දැක්විය හැකි ය.

පරිසරයේ ස්වාභාවික සම්පත් ආර්ථික නිෂ්පාදන සඳහා අවශ්‍ය වේ. එනම්, බලශක්තිය, ජලය, ජෛව ස්කන්ධ, ලෝපස් සහ වෙනත් සම්පත් ය. එහි දී ආර්ථික නිෂ්පාදන හේතු කොටගෙන මුදාහරිනු ලබන අපද්‍රව්‍ය පරිසරය විසින් අවශෝෂණය කරගනු ලබයි. එම සබඳතාව මෙහි පළමු කාණ්ඩය මඟින් විස්තර කරනු ලබයි. ස්වාභාවික සම්පත් පදනම මඟින් ස්වාභාවික සම්පත් තොගයේ ගුණාත්මකතාව මෙන් ම ප්‍රමාණාත්මකතාව මනිනු ලබයි. සෘජු ව ම ආර්ථික ක්‍රියාකාරකම් සඳහා බලපානු ලබන ස්වාභාවික සම්පත් තොගය (එනම්, පුනර්ජනනීය සම්පත් (දැව) සහ පුනර්ජනනීය නොවන සම්පත් (පොසිල බලශක්ති සංචිත) ඇගයීම ස්වාභාවික සම්පත් පදනම මඟින් සිදු වේ. ඒ මෙන් ම පරිසර පද්ධති සේවාවල අදාළ දර්ශක ද ස්වාභාවික සම්පත් පදනමට ඇතුළත් වේ.

ජීවිතවල පාරිසරික ගුණාත්මකතාව මඟින් පරිසරය සහ ජනගහනයේ ජීවිතවල ගුණාත්මකතාව අතර සම්බන්ධය පිළිබඳ ව සොයාබැලීමක් සිදුවේ. ඒ සේ ම දේශීය පාරිසරික ගැටලු පිළිබඳව ද සොයාබැලීමක් සිදුවේ.

හරිත ආර්ථිකයක් වෙත මාරුවීමේ දී, එම රටවල විශේෂිත තත්ත්ව මත විවිධ ප්‍රතිපත්ති ප්‍රතිචාර අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් රටවල් මේ සඳහා විවිධ ප්‍රතිපත්ති මෙවලම් එනම් බදු, සහනාධාර තෝරාගත හැක. අවසානයේ හරිත ආර්ථිකය කෙරෙහි සංක්‍රමණය වන අතර ඒ තුළින් ආර්ථිකමය අවස්ථා නිර්මාණය වේ. මෙම අන්තර් සබඳතාව ඉහතින් දක්වන ලද සංකල්පිත ක්‍රමවේදය තුළින් පිළිඹිබු වේ.

මේ අයුරින් බොහෝ සංවර්ධිත රටවල් හරිත ද.දේ.නි. කෙරෙහි යොමු වුවද, සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම සංකල්පය කෙරෙහි දක්වන නැඹුරුතාවයේ අඩුවක් දක්නට ඇත. එයට හේතු සලකා බැලීමේ දී එම රටවල මෙම සංකල්පය පිළිබඳ ව ඇති තොරතුරු හිඟතාව හෝ නොමැතිකමත්, හරිත ද.දේ.නි. ගණනය කිරීමට අවශ්‍ය දත්ත ඌනතාවත්, මේ පිළිබඳ ව ඇති තාක්ෂණික සහ සමාජ පිරිවැයේ හිඟකමත් දැක්විය හැකි ය.

### 4.7 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනයකිරීමේ අරමුණු මොනවාද?

(අ) පාරිසරික පිරිවැය හඳුනා ගැනීම, එකතු කිරීම, ගණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම.

(ආ) අභ්‍යන්තර වාර්තාකරණය සහ පාරිසරික පිරිවැය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම සහ තීරණ ගැනීම.

### 4.8 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ වාසි සහ අවාසි මොනවාද?

**වාසි**

(අ) ආයතනයක මූල්‍ය කාර්යසාධනය සහ හරිත ගිණුම්කරණය පිළිබඳ තීරණ ගැනීමට හැකිවීම.

(ආ) විශේෂයෙන් පාරිසරික පිරිවැය අවම කිරීමේ ඉලක්ක සපුරා ගැනීමටත්, පරිසරය කෙරෙහි ඇති ඍණාත්මක බලපෑම් හඳුනා ගැනීම සඳහාත් අවශ්‍ය වන්නා වූ තොරතුරු ලබාගත හැකි වීම.

(ඇ) පාරිසරික ක්‍රියාකාරකම්වල කාර්යසාධනය තක්සේරු කිරීම, පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීමට හැකි වීම.

**අවාසි**

පාරිසරික කාර්ය සාධනයන් හරිත ගිණුම්කරණය මඟින් නිවැරදි ව ඉදිරිපත්වීමක් සිදුවේ දැ යි කිව නො හැකි වීම.

### 4.9 හරිත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී මුහුණ පාන අභියෝග මොනවාද?

1. හරිත ද.දේ.නි. සංරචක පිළිබඳ එකඟත්වයක් නො මැතිවීම: හරිත ද.දේ.නි. ගණනය කිරීමේ දී යොදාගන්නා සංරචක මොනවාද යන්න පිළිබඳව පොදු එකඟතාවයක් නො මැතිවීම අභියෝගයකි.

2. ස්වාභාවික සම්පත් මිල කිරීමේ අපහසුකම: සාම්ප්‍රදායික ද.දේ.නි. ගණනය කිරීමේ දී භාණ්ඩ හා සේවාවල අගය මිල කිරීම පහසු වුවත්, හරිත ද.දේ.නි. ගණනය කිරීමේ දී ස්වාභාවික සම්පත්වල වටිනාකම මිල කිරීම අපහසු ය. මන්ද, ඒවා බහුතරයක් පොදු භාණ්ඩ වන අතර ම වෙළෙඳ භාණ්ඩ නො වන නිසාය. එ සේ ම වනාන්තර, ඛනිජ සම්පත්, පොසිල ඉන්ධන ආදී ස්වාභාවික සම්පත්වල වටිනාකම ස්ථාවර නො වන නිසා මිල කිරීම අපහසු වී ඇත. උදාහරණයක් ලෙස අවුරුදු 100 ක පමණ වයස්ගත ශාඛයක් අවුරුදු 1 ක් පමණ වයස්ගත ශාඛයකට වඩා වටිනාකමින් වැඩි ය. එ සේ ම නිසරු බිමක වැඩුණු ශාඛයකට වඩා වැසි වනාන්තරවල වැඩුණු ශාඛයක වටිනාකම වැඩිය.

3. ස්වාභාවික සම්පත්වල අපැහැදිලි බව: හරිත ද.දේ.නි. ගණනය කිරීමේ දී පවත්නා ස්වාභාවික සම්පත් ප්‍රමාණය පමණක් ගණනය කරනු ලබයි. නමුදු, පාරිසරික ගණනය කිරීමේ දී එයින් නිවැරදි දත්ත ලබා දෙන්නේ නැත. එබැවින් ඒ සඳහා පුළුල් වූ ජාතික මට්ටමේ සමීක්ෂණයක් සිදු කළ යුතු ය. එවිට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත මෙන් ම ස්වාභාවික සම්පත් තොගය සහ එහි වෙනස්විම පිළිබඳ දත්ත ද ලබාගත හැකි ය.

**නිගමනය**


මෙ වැනි අභියෝග පැවතුණ ද මෙම ද.දේ.නි. පිළිබඳ සංකල්පය මේ වන විට ප්‍රචලිත වෙමින් පවතින අතර එය බොහෝ රටවල පරීක්ෂණාත්මක අවධියේ පවතී. මේ මඟින් ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ව සාම්ප්‍රදායික ද.දේ. නිෂ්පාදනයට වඩා පූර්ණ වූ හා නිවැරදි වූ චිත්‍රයක් ලබා දේ. එබැවින් ශ්‍රී ලංකාව ද SEEA ක්‍රමවේදය පරීක්ෂණාත්මක මට්ටමින් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනීම කළ යුතු වේ.✪


**ආශ්‍රිත මූලාශ්‍ර:-**

1. The World Conservation Union (IUCN) - Environment Accounting - What it all about
2. United Nations Statistics Division, Integrated Environmental and Economic Accounting An Operational Manual - 2000
3. Statistics Division/Department of Economic and Social Affairs, United Nations, REVISION OF THE SYSTEM OF ENVIRONMENTAL - ECONOMIC ACCOUNTIG (SEEA)
4. UNEP, 2011, Towards a Green Economy
5. Karen Chapple, Defining the Green Economy - A Primer on Green Economic Development
6. China Green National Accounting Study Report - 2009
7. Towards Sustainable Development - Wuppertal Institute
8. World Bank Publication, The Little Green data Book 2012
9. Interim Report of the Green Growth Strategy: Implementing our commitment for a sustainable future Meeting of the OECD Council at Ministerial Level 27- 28 May 2010
10. SEEA 2003 and SEEA 2010
11. WWW.unep.org

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නවතම ප්‍රකාශන

# ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති






මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති සහ මුදල් මණ්ඩලයේ ලේකම් පී. සමරසිරි මහතා විසින් රචිත තෙවන ග්‍රන්ථය යි. මෙහි ආර්ථිකයක ක්ෂුද්‍ර, සාර්ව, මූල්‍ය, රාජ්‍ය සහ විදේශීය යන සෑම අංශයකම ක්‍රියාකාරිත්වයට අදාළ ප්‍රධාන න්‍යායාත්මක සහ ප්‍රායෝගික කරුණු ද විශ්ලේෂණ ක්‍රම ද පියවරින් පියවර ඉතාමත් ම සරල බස් වහරකින් ඉදිරිපත් කර යි. එමනිසා ග්‍රන්ථය පරිශීලනය ඉතාමත් පහසුය. මෙය අ.පො.ස. උසස් පෙළ, විශ්ව විද්‍යාල සහ වෘත්තීමය පාඨමාලාවල ආර්ථික විද්‍යාව සහ මූල්‍ය විෂයයන් හදාරන සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට ඉතා ප්‍රයෝජනවත් ආර්ථික විද්‍යා ග්‍රන්ථයකි.

ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සහ මූල්‍ය කටයුතු පිළිබඳව සාමාන්‍ය දැනුම මෙන්ම විෂය දැනුම මහජනයා අතර බෙදා හැරීම පිණිස විවිධ ප්‍රකාශන සහ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. සමරසිරි මහතාගේ මෙම තෙවැනි ආර්ථික විද්‍යා ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම ද ඒ සඳහා ගත් තවත් එක් පියවරකි.

**මෙය රාජගිරියෙහි පිහිටි මහ බැංකු විදු පියසෙහි අලෙවි කවුළුවෙන් ද, පළාත් කාර්යාලවලින් ද මිලදී ගත හැකිය. ග්‍රන්ථයෙහි මිල රු. 750/- කි.**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.